# ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

# වෙළඳ ගිවිසුම



DFCC BANK
Keep Growing

**මෙම ගිවිසුම,**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PQ 233 යටතේ විධිමත්ව සංස්ථාපිත කොළඹ 03, ගාලු පාර, අංක 73/5 දරණ ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී (මෙහි මින්මතු එකී ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හෝ එහි අනුප්‍රාප්තිකයින්ද ඇතුළුව 'බැංකුව' යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන ("බැංකුව")) බැංකු සමාගම එක් පාශර්වයක් වශයෙන්ද,**

**සහ**

**** සටහන : අදාළ නොවන වචන කපාහැර අදාළ වගන්තිය සම්පූණර් කරන්න***

**(තනි පුද්ගලයෙකු නම්)**

**......................................................................................... දරණ ලිපිනයේ සිය ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන ........................................................................ (ජා.හැ.ප. අංක ................................. ) (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ............................................................. ගේ අර්ථය සහ සංදභර්ය තුළ අවශ්‍ය පරිදි ඔහුගේ/ඇයගේ බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් සහ/හෝ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**(හිමිකාරත්ව ව්‍යාපාරයක් නම්)**

**................................................................................... දරණ ලිපිනයේ ............................................ යන නාම විලාශයෙන් හිමිකාරත්ව ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ........................................................................ (ජා.හැ.ප. අංක .................................. ) (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ..........................................................................ගේ අර්ථය සහ සංදභර්ය තුළ අවශ්‍ය පරිදි ඔහුගේ/ඇයගේ බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් සහ/හෝ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**(සමාගමක් නම්)**

**ශ්‍රී ලංකාවේ වලංගු නීතිය යටතේ විධිමත්ව සංස්ථාපිත ................................................................................ දරණ ලිපිනයේ අංක .................................... දරණ ලියාපදිංචි අංකය යටතේ සිය ලියාපදිංචි කායර්ාලය පවත්වාගෙන යනු ලබන .......................................................................... (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ........................................................................ ගේ අර්ථය සහ සංදභර්ය තුළ අවශ්‍ය පරිදි ඔහුගේ/ඇයගේ බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් සහ/හෝ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**(හවුල් ව්‍යාපරයක් නම්)**

**පිළිවෙලින් ජා.හැ.ප. අංක ..................................V, ..................................V, ..................................V සහ ................................V දරණ ........................................................., .........................................................., ...................................................., ................................................. සහ ........................................................ (හවුල් ව්‍යාපාරිකයින්ගේ නම්) යන අය විසින් හවුල් ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන.................................................... යන නාම විලාශයෙන් ලියාපදිංචි හවුල් ව්‍යාපාරය (ලියාපදිංචි අංකය : ……………) ......................................................................... (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ......................................................................... ගේ අර්ථය සහ සංදභර්ය තුළ අවශ්‍ය පරිදි ඔවුන්ගේ බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් සහ/හෝ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**(සමාජයක්/සමිතියක් නම්)**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක ............................................ දරණ ස්ථානයේ සිය ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන සමාජයක්/සමිතියක් වන ................................................................... (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ..................................................................................... ගේ අර්ථය සහ සංදර්භය තුළ අවශ්‍ය පරිදි එහි බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් සහ/හෝ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) යන අය අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**(රාජ්‍ය ආයතනයක් නම්)**

**............ අංක ............. දරණ ................................................................ පනතින්/ආඥාපනතින් විධිමත්ව ස්ථාපනය කරන ලද ........................................................................................ දරණ ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ................................................................ (මෙහි මින්මතු "වෙළෙන්දා" යනුවෙන් හඳුන්වනු සහ කියනු ලබන සහ, එකී ................................................................................ ගේ අර්ථය සහ සංදර්භය තුළ අවශ්‍ය පරිදි එහි අනුප්‍රාප්තිකයින් සහ අවසරලත් භාරකරුවන්ද ඇතුළුව) අනෙක් පාශර්වය වශයෙන්ද ගෙන,**

**එකී ........................................................................................... අතර**

**දෙදහස් ............................ (20.......) .................... මස ................. (..........) (අත්සන් කරනු ලබන දිනය) දින අත්සන් කරනු ලැබේ.**

**කෙසේ නමුත් බැංකුව, බැංකු මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලබන බලයලත් වාණිජ බැංකුවක් වේ.**

**ඒ අනුව වෙළෙන්දා, උපකරණ විකිණීමේ ප්‍රස්තුතයක් භාවිතා ගනිමින් එදිනෙදා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමේ අභිලාෂයෙන් ......................................................................... නමැති ව්‍යාපාරයේ නිරතව සිටී.**

**එසේ හෙයින් බැංකුව, පහත විස්තර කොට ඇති කොන්දේසි සහ නියමයන්ට යටත්ව වෙළෙන්දා වෙත උපකරණ විකිණීමේ ප්‍රස්තුතය සැපයීමට අපේක්ෂා කරයි.**

**මෙම ගිවිසුම සහ, පහත දැක්වෙන කොන්දේසි සහ නියමයන්, බලයලත් මුල්‍ය ආයතනයක් විසින් නිකුත් කර ඇති වලංගු කාඩ්පතකින් සහ/හෝ ජංගම යෙදවුමක් (මෙහි මින්මතු "කාඩ්පත/ජංගම යෙදවුම" යනුවෙන් හඳුන්වනු ලබන) අනුසාරයෙන් සිදුකරනු ලබන ගෙවීම්ද ඇතුළුව සියලුම ගනුදෙනු සඳහා අදාළ වේ.**

1. **අර්ථ දැක්වීම්**
   **මෙම කොන්දේසි තුළ කොන්ත්‍රාත්තුව සඳහා පහත පරිදි අර්ථ දැක්වීම සිදු කෙරේ.**

   1.1 **"ගිවිසුම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සහ වෙළෙන්දා අතර ඇති කරගනු ලබන වෙළඳ ගිවිසුම වන අතර, එහි දැක්වෙන නියමන් කලින් කලට වෙනස් විය හැක.**
   1.2 **"බැංකුව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වේ.**
   1.3 **"කාඩ්පත" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, නිකුත් කිරීමේ ආයතනය සහ විවිධ ගෙවීම් සමාගම් අතුළත් වූ ගිවිසුම් පදනම් කරගෙන යම් නිකුත් කිරීමේ ආයතනයක් විසින් ගනුදෙනුකරු වෙත නිකුත් කරනු ලබන හර/බැර/වටිනාකම තැන්පත් කර ඇති භෞතික හෝ අතථ්‍ය කාඩ්පතක් වේ.**
   1.4 **"කාඩ්පත දරන්නා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, යම් නිකුත් කිරීමේ ආයතයක් විසින් යම් පුද්ගලයෙකුගේ නමින් නිකුත් කර ඇති යම් කාඩ්පතක් හෝ ජංගම යෙදවුමක් භාවිතා කරන පුද්ගලයා වේ.**
   1.5 **"බැර තුණ්ඩුව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ, නිකුත් කිරීමේ බැංකුව, වෙළෙන්දා සහ බැංකුව අතර එකඟවූ හේතුන් නිසා ගනුදෙනුකරු වෙත ආපසු ලබාදෙන මුදල වේ.**

1.6 “ගනුදෙනුකරු” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, යම් නිකුත් කිරීමේ ආයතනයක් විසින් වෙළෙන්දා වෙත සපයා ඇති කාඩ්පතක් හෝ යම් ජංගම යෙදවුමක් දරනු ලබන යම් පුද්ගලයෙකු වේ.

1.7 “වට්ටම් මුදල” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, වට්ටම් අනුපාතයට අනුව ගණනය කරනු ලබන ඒ ඒ ගනුදෙනුව වෙනුවෙන් වෙළෙන්දා විසින් බැංකුව වෙත ගෙවිය යුතු ගාස්තු වේ.

1.8 “වට්ටම් අනුපාතය” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, වෙළෙන්දා විසින් බැංකුව වෙත ගෙවිය යුතු ගනුදෙනුවේ වටිනාකමෙහි ප්‍රතිශතය වේ.

1.9 “උපකරණ” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, සිම් පත්, මුද්‍රණ යන්ත්‍ර, ජංගම දුරකථන, ජංගම සංනිවේදන උපකරණ සහ අදාල සියලුම උපාංගද ඇතුළුව ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍ර වේ.

1.10 “අවම සීමාව” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, බැංකුවේ අවසරයක් නොමැතිව ගනුදෙනු කටයුතු සිදුකළ හැකි සීමාව දක්වා වන වෙළෙඳුන් සඳහා බැංකුව විසින් නිශ්චය කරනු ලබන මුදල වේ. එවැනි තත්ත්වයන් සහ මුදල් ප්‍රමාණ බැංකුවේ අභිමතය පරිදි තීරණය කරනු ලබන අතර, ඒ බැව් අවශ්‍ය වන පරිදි වෙළෙඳුන් වෙත දැනුම් දෙනු ඇත.

1.11 “නිකුත් කිරීමේ ආයතනය” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, බැර/හර/වටිනාකම් තැන්පත් කර ඇති යම් භෞතික හෝ අතථ්‍ය කාඩ්පත් යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් වේ.

1.12 “වෙළෙන්දා” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, බැංකුවේ උපරිම දැනුමේ හැටියට බැංකුව විසින් සපයනු ලබන යම් ගෙවීම් භාරගැනීමේ යාන්ත්‍රණයක් පිළිගැනීම මත නෛතිකව විකිණීමට බලයලත් භාණ්ඩ සහ/හෝ සේවාවන් විකිණීමේ යාන්ත්‍රණයක් භුක්තිවිඳිනු ලබන පුද්ගලයෙකු හෝ ආයතනයක් වේ.

1.13 “ගෙවුම් සමාගම්” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, වීසා, මාස්ටර් කාඩ්පත්, ඇමෙක්ස්, යූනියන් පේ, ලංකා පේ ආදිය ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී විශේෂිත වූ සන්නාම යටතේ කාඩ්පත් නිකුත් කිරීමට සහ ගනුදෙනු ලබාගැනීමට සිය සාමාජිකයින්ට බලය ලබාදෙන ආයතන වේ.

1.14 “විකුණුම් තුණ්ඩුව” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ඉලෙක්ට්‍රෝනික උපදෙස්, අත්පොත් සහ ඉක්මන් ප්‍රතිචාර කේතය (QR) පදනම් කරගත් ගනුදෙනු වේ.

1.15 “ගනුදෙනුව” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ගනුදෙනුකරුගේ අනුදැනුම ඇතිව හෝ නැතිව ජංගම යෙදවුම්, ටෙලි බැංකින්, කෝල් බැංකින්, ඊ-වොලට් සහ අන්තර්ජාල ගෙවීම් ද්වාර (ඉන්ටනෙර්ල් පේමන්ට් ගේට්වේස්), නියර් ෆීල්ඩ් කොමියුනිකේෂන් ආදී සේවාවන්ට/නිෂ්පාදනවලට අදාලව විස්තර කරනු ලබන කොන්දේසි පරිදි එකී සේවාවන් ඇතුළුව පහසුකම් සලසනු ලබන කාඩ්පතක්, පෞද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) සහිතව/රහිතව හෝ වෙනත් ගෙවීම් චැනලයක් භාවිතා කරමින් සිදුකරනු ලබන යම් ගනුදෙනුවක් වේ.

1.16 “ජංගම යෙදවුම” යනුවෙන් අදහස් කරනු ලබන්නේ, මූල්‍ය ආයතනයක් විසින් සපයනු ලබන, ගනුදෙනුකරු විසින් ජංගම උපකරණයකට භාගත (Download) කරගනු ලබන ඉක්මන් ප්‍රතිචාර කේතය (QR) ගෙවීමද ඇතුළුව එහෙත් එයට සීමා නොවී ගෙවීම් සිදුකිරීමට භාවිතා කරනු ලබන මෘදුකාංග යෙදවුමක් වේ.

2. ක්‍රියාවලිය

මෙම ගිවිසුමෙම කොටසක් ලෙස අඩංගුවන (ඇමුණුම එක (01) විධිමත්ව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය වෙළෙන්දා විසින් බැංකුවට ඉදිරිපත් කළ යුතු ය.

3. ගරු කාඩ්පත / ජංගම යෙදවුම

ගනුදෙනුකරු විසින් නිසි පරිදි සිදුකරනු ලබන ගෙවීමක් ලෙස කාඩ්පතක්/ජංගම යෙදවුමක් පදනම් කරගෙන ඉදිරිපත් කරනු ලබන සිදුකරනු ලබන සෑම ගෙවීමකටම වෙළෙන්දා ගරු කළ යුතු ය. භාරගනු ලබන යම් වෙනත් තරක්කුරු (තරඟකාරී) කාඩ්පතක/ජංගම යෙදවුමක සන්නාමයක් උදෙසා විශේෂිත වූ කාඩ්පතක්/අතථ්‍ය ජංගම යෙදවුමක් භාවිතා කිරීම වෙනස් කොට සැලකීමට එරෙහිව හෝ එවැන්නක් භාවිතා කිරීම අධෛර්යමත් කිරීමට එරෙහිව භාරගැනීමේ පිළිවෙත් හෝ ක්‍රියාවලීන්හි වෙළෙන්දා නිරත නොවිය යුතු ය.

4. අවලංගු/පිළිගත නොහැකි ගනුදෙනු

කාඩ්පත/ජංගම යෙදවුම කල් ඉකුත්වී/අවලංගු වී ඇත්නම් හෝ අවසරදීමේ ක්‍රියාවලිය තුළ නිකුත් කරන්නා විසින් ගනුදෙනුව වරනහා ඇත්නම් වෙළෙන්දා විසින් ගනුදෙනුව සම්පූර්ණ නොකල යුතු ය.

5. බලය ලබාදීම

**5.1** හස්තමය වශයෙන් බලය ලබාදීම

පහත කරුණු සම්පූර්ණ කරන්නේ නම් බැංකුව තුළ තිබෙන බලය ලබාදීමේ මධ්‍යස්ථානයෙන් වෙළෙන්දා විසින් බලය ලබාගත යුතු අතර, බලය ලබාදීමේ අංකය, ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර විකුණුම් තුණ්ඩුව මත කියවිය හැකි පරිදි සටහන් කළ යුතු ය.

(අ) එක් දිනක් තුළ දරනු ලබන ගාස්තුවක හෝ ගාස්තු මාලාවක වටිනාකම, කලින් කලට බැංකුව විසින් උපදෙස් දෙනු ලබන පරිදි අවම සීමාව ඉක්මවා යන්නේ නම්, හෝ

(ආ) වෙළෙන්දා විසින් ප්‍රමාදවී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, හෝ

(ඇ) ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ කාඩ්පත ඉදිරිපත් නොකරන්නේ නම්, හෝ

(ඈ) කාඩ්පත ව්‍යාජ ලෙස සකස් කරන ලද එකක් බවට හෝ එය නැතිවූ හෝ සොරකම් කරන ලද බවට වෙළෙන්දා විශ්වාස කරන්නේ නම්, හෝ

(ඉ) ඉදිරිපත් කිරීම වටා හෝ යෝජිත ගනුදෙනුව වටා සැකකටයුතු වාතාවරණයක් ඇත් නම් ය.

**5.2** ඉලෙක්ට්‍රෝනිකමය වශයෙන් බලය ලබාදීම

යම් හෙයකින් බැංකුවේ බලය ලබාදීමේ ක්‍රියාවලි පද්ධතියට ("පද්ධතිය") ප්‍රවේශවිය හැකි ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ටමරීනලයක් ("EDCT") වෙළෙන්දා සතුව තිබෙන්නේ නම්, සෑම ගනුදෙනුවක් සඳහාම වන බලය, එකී ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ටමරීනලය ("EDCT") ඔස්සේ වෙළෙන්දා විසින් ලබාගත යුතු ය. ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ටමරීනලයේ ("EDCT") බිඳවැටීමකදී හෝ යම් හේතුවක් නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවකදී, එවැනි බලය ලබාගැනීමක් මෙහි 5.1 වගන්තියට අනුකූලව බැංකුවේ බලය ලබාදීමේ මධ්‍යස්ථායෙන් වෙළෙන්දා විසින් ලබාගත යුතු ය.

**5.3** යම් හෙයකින් බැංකුවේ පද්ධතියට ප්‍රවේශවිය හැකි ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") වෙළෙන්දා සතුව තිබෙන්නේ නම්, සෑම ගනුදෙනුවක් සඳහාම වන බලය, එකී ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") ඔස්සේ වෙළෙන්දා විසින් ලබාගත යුතු ය. ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") බිඳවැටීමකදී හෝ යම් හේතුවක් නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවකදී, එවැනි බලය ලබාගැනීමක් මෙහි 5.1 වගන්තියට අනුකූලව බැංකුවේ බලය ලබාදීමේ මධ්‍යස්ථායෙන් වෙළෙන්දා විසින් ලබාගත යුතු ය.

5.4 යම් හෙයකින් වෙළෙන්දා සතුව වෙළඳ යෙවුමක් (Merchant App) තිබෙන්නේ නම්, සෑම ගනුදෙනුවක් සඳහාම වන බලය, එකී වෙළඳ යෙවුමක් (Merchant App) ඔස්සේ වෙළෙන්දා විසින් ලබාගත යුතු ය. වෙළඳ යෙවුමෙහි (Merchant App) බිඳවැටීමකදී හෝ යම් හේතුවක් නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවකදී, ගනුදෙනුව අසම්පූර්ණ එකක් බවට සලකනු ඇත.

6. කාඩ්පත් රඳවා තබාගැනීම සහ සම්ද්ධකරණය (වැරදි සකස් කිරීම)

වෙළෙන්දා විසින් කාඩ්පත පහත දැක්වෙන සාධාරණ වූත් සාමකාමී වූත් අදහසින් සිය හොඳම ප්‍රයත්නය ඇතිව භාවිතා කළ යුතු ය.

(අ) බලය ලබාදීමේ ඉල්ලීමක් සිදුකරනු ලබන අවස්ථාවකදී කාඩ්පත තමා ළඟ තබාගැනීම.

(ආ) බලය ලබාදීමේ මධ්‍යස්ථානය විසින් දෙනු ලබන උපදෙස් හෝ විධානයන්ට අනුකූලවීම.

7. මුදල්මය ගෙවීම් සහ ව්‍යවහාර මුදල්

7.1 විකුණුම් තුණ්ඩුවක සඳහන් භාණ්ඩ හෝ සේවාවන් සඳහා වන ගාස්තු වෙනුවෙන් කිසිදු ගෙවීමක් කාඩ්පත දරන්නාගෙන් වෙළෙන්දා විසින් ලබා නොගත යුතු ය.

7.2 බැංකුව සහ වෙළෙන්දා අතර ඇතිකරගනු ලබන ලිඛිත එකඟතාවයකින් මිසක සෑමවිටම විකුණුම් තුණ්ඩු, ශ්‍රී ලංකා රුපියල්වලින් සලකුණු කළ යුතු ය.

8. **ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය / ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") / ඩීඑෆ්සීසී ඉක්මන් ප්‍රතිචාර කේතය (QR), ස්ටිකර** සහ අනිකුත් ප්‍රවර්ධන සවිකිරීම් (Decal).

**බැංකුවට යෝග්‍ය සහ මැනවැයි හැඟෙන ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය / ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") / ඩීඑෆ්සීසී ඉක්මන් ප්‍රතිචාර කේතය (QR)** ගෙවුම් ස්ටිකර සහ ප්‍රවර්ධන සවිකිරීම් (Decal) සහ, එවැනි අදාළ උපාංග සහ මෘදුකාංග (සාමූහිකව "උපකරණ" ලෙස අදහස් කරනු ලබන සහ එවැනි අදහස් කිරීමකට ප්‍රතිස්ථාපනය කිරීම්, වෙනස් කිරීම්, වැඩි කිරීම් සහ/හෝ එකතු කිරීම්ද අතුළත් වේ) වෙළෙන්දාගේ පරිශ්‍රය තුළ සවිකරන ලෙසට වෙළෙන්දාගෙන් බැංකුව ඉල්ලා සිටිය හැකි ය.

9. **ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය / ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS")** ක්‍රියාත්මක කිරීම.
**බැංකුව විසින් වෙළෙඳුන්ගේ පරිශ්‍ර සඳහා බෙදාහැර සහ ස්ථාපනය කර ඇති සියලුම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍ර / ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය ("MPOS") / ඩීඑෆ්සීසී ඉක්මන් ප්‍රතිචාර කේතය (QR)** ගෙවුම් ස්ටිකර සහ ප්‍රවර්ධන සවිකිරීම් (Decal).

(අ) බැංකුව විසින් වෙළෙන්දා වෙත කලින් කලට දෙනු ලබන උපදෙස්වලට අනුකූලව ක්‍රියා කරවිය යුතු ය.
(ආ) එකී උපකරණය ක්‍රියාකරවීමේදී වැයවන යම් විදුලිබල ප්‍රමාණයක් සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් දුරකථන සහ/හෝ දත්ත ඇසුරුම් මාර්ග ගාස්තු (**data pack line charges**) සඳහා වගකිව යුතු ය.
(ඇ) උපකරණයේ ස්ථාපනය කොට ඇති වැඩසටහන වෙනස් කිරීම හෝ එය කඩාබිඳ දැමීම නොකළ යුතු ය.
(ඈ) සෑමවිටම සාමාන්‍ය ව්‍යාපාරික කාලය තුළ උපකරණය ක්‍රියාකරවීමට හැකිවන පරිදි අඩු ගණනේ වෙළෙන්දාගේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකුවත් (විකුණුම් නිලධාරියෙකු සහ සුපරීක්ෂකවරයෙකු) පුහුණු කර තිබීමට වෙළෙන්දා වගබලාගත යුතු ය.
(ඉ) උපකරණය ක්‍රියාකරවීමේදී යම් වරදක් හෝ සැකකටයුතු වරදක් සිදුවුවහොත් වහාම ඒ බැව් බැංකුවට දැන්විය යුතු ය.
(ඊ) බැංකුවේ කැමැත්තක් නොමැතිව උපකරණයේ කිසිවක් ඉවත් කිරීම, එයට බාධා කිරීම, උපකරණයට යම් එකතු කිරීමක් සිදුකිරීම හෝ ඒ මත යම් ලකුණු කිරීම් සිදුකිරීම අවසර නොතිබිය යුතු ය.
(උ) පද්ධතියට අදාලව බැංකුවෙන් ලැබෙන සියලුම තොරතුරු අතිශය රහසිගතව තබාගත යුතු අතර, ඒවා හෙළිකල යුත්තේ උපකරණය ක්‍රියාකරවීමට අවශ්‍ය යැයි සිය කාර්යමණ්ඩලය විසින් දැන්වූ පසුව සහ පද්ධතිය ක්‍රියාකරවීමට අවශ්‍ය අවස්ථාවලදී පමණි. එවැනි රහස්‍යභාවයන්, බැඳීම් සම්බන්ධයෙන් සිය කාර්යමණ්ඩලය දැනුවත් කිරීමට අවශ්‍ය සියලුම පියවරයන් වෙළෙන්දා විසින් ගත යුතු අතර, විශේෂයෙන්ම එහෙත් ඒවාට සීමානොවී පද්ධතිය භාවිතා කිරීමට බලපෑ හැකි පිටපත් කිරීම් සහ පර්යන්ත ආරම්භක ක්‍රියාවලින් සම්බන්ධයෙන් දැඩි ආරක්ෂක ක්‍රියාමාර්ග පවත්වාගත යුතු ය.
(ඌ) බැංකුවේ පූර්ව ලිඛිත කැමැතතක් රහිතව කිසිඳු කාර්යයක් පිණිසවත් උපකරණය භාවිතා කිරීමට තෙවන පාර්ශවයකට අවසර නොදිය යුතු ය.

10. **ගනුදෙනු හැසිරවීම**

10.1 වෙළෙන්දා විසින් ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ටර්මිනලය/ටර්මිනල **("EDCT(s)")** සහ අනිකුත් උපාංග ඔස්සේ ගනුදෙනු හැසිරවිය යුත්තේ පහත පරිදි ය.

**(අ)** ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ටර්මිනලය/ටර්මිනල **("EDCT(s)")** සහ අනිකුත් උපාංග බැංකුවට පිළිගත හැකි ඒවා බවට වගබලා ගත යුතු ය.
**(ආ) කාඩ්පත්වලින් දත්ත උපුටා ගැනීම, බැංකුව විසින් විශේෂ කොට දක්වන ලද අයුරින් සිදුවිය යුතු බවට වගබලාගත යුතු ය (මෙය කලින් කලට වෙනස්විය හැකි අතර, වෙනස්වීම් පිළිබඳ පූවර් දැනුම්දීමක් බැංකුව විසින් වෙළෙන්දාට සිදුකරනු ඇත).**

(ඇ) **කලින් කලට බැංකුවට අවශ්‍ය කරනු ලබන ගනුදෙනු කරනු ලබන මුදල සහ යම් වෙනත් තොරතුරක් (කාඩ්පත දරන්නාගේ අංකය සහ දත්ත වැනි), බැංකුව විසින් අනුමත කරන ලද ආකෘතිය පරිදි පයර්න්ත ලදුපතක මුද්‍රණය කිරීමට වගබලාගත යුතු ය.**

(ඈ) **මෙම ගිවිසුමේ කායර්ය පිණිස දත්ත ඉලෙක්ට්‍රෝනික උපුටා ගැනීම, රඳවා තබාගැනීම සහ ප්‍රේෂණය කිරීම සඳහා මෘදුකාංග තාක්ෂණික ප්‍රමිති සහ ක්‍රියාවලි** බැංකුව විසින් **අනුමත කළ යුතු ය, නැතහොත් බැංකුවේ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය (අවශ්‍ය විය හැකි පරිදි).**

(ඉ) **අදාල විකුණුම් සටහන් කරමින් ණයපත් තුණ්ඩුව/විකුණුම් ඉන්වොයිසිය කාඩ්පත දරන්නා විසින් අත්සන් කළ යුතු ය.**

(ඊ) ගනුදෙනුකරුගේ අත්සන, ඔහුගේ/ඇයගේ කාඩ්පතෙහි පසුපිටේ තිබෙන අත්සන සමඟ සංසන්දනය කොට එය සමාන බවටත්, කාඩ්පතෙහි ගනුදෙනුකරුගේ ඡායාරූපයක් තිබේ නම් එය කාඩ්පත දරන්නාගේම ඡායාරූපය බවටත් සංසන්දනය කොට තහවුරු කළ යුතු ය. ණයපත් තුණ්ඩුවේ/විකුණුම් ඉන්වොයිසියේ සියලුම පිටපත්වල අත්සන තිබෙන බවට වෙළෙන්දා වගබලාගත යුතු ය.

(උ) ගනුදෙනුව සම්පූර්ණ කිරීම පෙර, නෙරා ඇති පරිදි මුද්‍රිත (embossed) සහ ප්‍රදර්ශිත කාඩ්පත් අංකය අතර වෙනසක් නොමැති බවට වගබලාගත යුතු ය.

(ඌ) ගනුදෙනුකරු වෙත ණයපත් තුණ්ඩුවේ සත්‍ය සහ සම්පූර්ණ කරන ලද පිටපතක් යැවිය යුතු ය.

(එ) ගිණුම් කටයුතුවල කාර්යය පිණිස දෛනික ගනුදෙනුවල විස්තරාත්මක වාර්තාවක් ලබාගත යුතු ය. බැංකුවේ පිටපත, පර්යන්ත අංකය මගින් ගොනු කොට ඉන් පසුව තැන්පතු සාරාංශය සමඟ ගනුදෙනු අනුක්‍රම පිළිවෙල යන මේවා බැංකුව සහ වෙළෙන්දා අතර වන ලිඛිත එකඟතාවයකින් මිසක වැඩකරන දින හතක් ඇතුළත බැංකුවේ වාර්තා සඳහා ආපසු භාරදිය යුතු ය. වෙළෙන්දාගේ පිටපත, අඩු ගණනේ අවුරුද්දක කාලයක්වත් ඔහු/ඇය ළඟ තබාගත යුතු අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවලදී ඉදිරිපත් කළ යුතු ය.

(ඒ) තනි පුද්ගල විකුණුම්, බැර තුණ්ඩු ගිණුම් සහ බලයදීම සහිතව හස්තමය ගනුදෙනු සඳහා ශුද්ධ එකතුව ලැයිස්තුගත කරමින් තැන්පතු තුණ්ඩුවක් සමඟ ගොනු කළ යුතු ය ((උදා : ඇමතුම් බැංකු කටයුතු (Call Bank) වැනි තත්ත්වයන්හිදී)).

10.2 වෙළෙන්දා විසින් ගනුදෙනුවේදී/ගනුදෙනු කටයුතුවලදී **ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය** ("MPOS") හැසිරවිය යුතු ය.

(අ) කාඩ්පත්වලින් දත්ත උපුටා ගැනීම බැංකුව විසින් විශේෂ කොට දක්වා ඇති ආකාරයට අනුව සිදුකිරීමට වගබලාගත යුතු ය **ය (මෙය කලින් කලට වෙනස්විය හැකි අතර, වෙනස්වීම් පිළිබඳ පූවර් දැනුම්දීමක් බැංකුව විසින් වෙළෙන්දාට සිදුකරනු ඇත).**

(ආ) මෙම ගිවිසුමේ කාර්යය පිණිස දත්ත ඉලෙක්ට්‍රෝනික උපුටා ගැනීම, රඳවා තබාගැනීම සහ ප්‍රේෂණය කිරීම සඳහා මෘදුකාංග තාක්ෂණික ප්‍රමිති සහ ක්‍රියාවලි බැංකුව විසින් අනුමත කළ යුතු ය, නැතහොත් බැංකුවේ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය (අවශ්‍ය විය හැකි පරිදි).

(ඇ) අදාල විකුණුම් සටහන් කරමින් අත්සන් තීරය මත ගනුදෙනුකරුගේ අත්සන ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

(ඈ) අත්සන් තීරය මත තිබෙන ගනුදෙනුකරුගේ අත්සන, ඔහුගේ/ඇයගේ කාඩ්පතෙහි පසුපිටේ තිබෙන අත්සන සමඟ සංසන්දනය කොට එය සමාන බවටත්, කාඩ්පතෙහි ගනුදෙනුකරුගේ ඡායාරූපයක් තිබේ නම් එය කාඩ්පත දරන්නාගේම ඡායාරූපය බවටත් සංසන්දනය කොට තහවුරු කළ යුතු ය.

(ඉ) ගනුදෙනුව සම්පූර්ණ කිරීම පෙර, නෙරා ඇති පරිදි මුද්‍රිත (embossed) සහ ප්‍රදර්ශිත කාඩ්පත් අංකය අතර වෙනසක් නොමැති බවට වගබලාගත යුතු ය.

10.3 වෙළෙන්දා යම් ගනුදෙනුවක් **ඉලෙක්ට්‍රෝනික දත්ත හසුකර ගැනීමේ ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය / ජංගම ක්‍රෙඩිට් කාඩ් යන්ත්‍රය** ("MPOS") ඔස්සේ හසුරුවනු නොලබන අවස්ථාවක ඒ සඳහා හස්තමය විකුණුම් වවුචරයක් භාවිතා කළ යුතු ය. හස්තමය විකුණුම් වවුචරයක්, බැංකු පිටපත, වෙළෙන්දාගේ පිටපත සහ ගනුදෙනුකරුගේ පිටපත වශයෙන් පිටපත් තුනක් (3) සහිතව වෙළෙන්දා සතුව තිබිය යුතු අතර, ඒ මත

(අ) කාඩ්පතෙහි සඳහන් කර ඇති දත්ත කියවිය හැකි පරිදි මුද්‍රණය කොට වෙළෙන්දාගේ නම සහ ගිණුම් අංකය ඇතුළත් කළ යුතු ය.

(ආ) විකුණන ලද භාණ්ඩ හෝ සේවාවන් පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් ඇතුළත් කොට මිළ, ශ්‍රී ලංකාවේ වලංගු රුපියල්වලින් සහ ගනුදෙනුව සිදුකරන ලද දිනය සඳහන් කළ යුතු ය.

(ඇ) ගනුදෙනුකරුගේ අත්සන ලබාගෙන එය කාඩ්පතෙහි තිබෙන අත්සන සමඟ සංසන්දනය කොට එවා සමාන බවට නිශ්චර කර ගැනීමෙන් පසුව කාඩ්පතෙහි ඡායාරූපයක් ඇත්නම් එයද ගනුදෙනුකරුගේ ඡායාරූපය බවට නිශ්චය කරගත යුතු ය. විකුණුම් තුණ්ඩුවල සහ විකුණුම් ඉන්වොයිසිවල සියලුම පිටපත්වල අත්සන තිබෙන බවට වෙළෙඳන්දා වගබලාගත යුතු ය.

(ඈ) විකුණුම් තුණ්ඩුවෙහි සත්‍ය සහ සම්පූර්ණ පිටපතක් ගනුදෙනුකරු වෙත යැවිය යුතු ය.

**11. විවිධ විකුණුම් පත්‍ර**

**අවසරය ලබාදීම වැලැක්වීම පිණිස විකුණුම් පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් වෙළෙන්දා විසින් භාවිතා නොකළ යුතු අතර, එය පහත අවස්ථාවලදී හැර හිඟව පවතින මුදලින් කොටසක් තනි විකුණුම් තුණ්ඩුවකට ඇතුළත් කර තිබෙන අවස්ථාවකදී පමණක් ගනුදෙනුවට බලනොපෑම් ඇති නොකළ යුතු ය.**

**(අ) මුදලෙහි ඉතිරිය මුදලින් හෝ චෙක්පතක් මගින් ගෙවනු ලබන විට, හෝ**

**(ආ) භාණ්ඩ හෝ සේවාවන් ලබාදීම හෝ ඉටුකිරීම සිදුකළ යුත්තේ පසු දිනක සහ එක් විකුණුම් තුණ්ඩුවක් මගින් තැන්පතුව නියෝජනය කරන්නා වූද, දෙවෙනි විකුණුම් තුණ්ඩුව මගින් ඉතිරි මුදල ගෙවීම නියෝජනය කරන්නා වූද අවස්ථාවක වෙළෙන්දා විසින් අවසරය ලබාගත යුතු මෙන්ම විකුණුම් තුණ්ඩුව මත අදාල පරිදි අවසරදීමේ අංකය සහ "තැන්පතුව" හෝ "ඉතිරිය" යනුවෙන් සටහන් කළ යුතු ය. විකුණුම් තුණ්ඩුවල "භාණ්ඩ ලබාදෙන තෙක් හෝ සේවාවන් ඉටුකරන තෙක් ඉතිරිය ඉදිරිපත් නොකරනු ඇත" යනුවෙන් ලේබල් කළ යුතු ය.**

**12. ලියවිලි සහ මුදල් ආපසුදීම් ඉදිරිපත් කිරීම**

**12.1 හස්තමය වශයෙන්/ඉලෙක්ට්‍රෝනිකව සිදුකරනු ලබන ගනුදෙනු**

**(අ) *හස්තමය වශයෙන් සිදුකරනු ලබන ගනුදෙනු***

**සම්පූර්ණ වශයෙන් සහ අදාල විකුණුම් තුණ්ඩු අමුණමින් බැංකුවට අවශ්‍ය විය හැකි පරිදි තැන්පතු තුණ්ඩුවක් සහ/හෝ එවැනි වෙනත් ලේඛනයක් වෙළෙන්දා විසින් සම්පූර්ණ කළ යුතු ය. වෙළෙන්දා වෙත ගෙවිය යුතු සම්පූර්ණ මුදල, ගනුදෙනුව සිදුකොට දින හතක් (7) තුළ වට්ටම් ලබාදීමෙන් පසුව ශුද්ධ අගය වශයෙන් ගණනය කළ යුතු ය.**

**(ආ) *ඉලෙක්ට්‍රෝනිකව සිදුකරනු ලබන ගනුදෙනු***

**වෙළෙන්දා විසින් එවැනි තොරතුරු ඉලෙක්ට්‍රානිකව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බැංකුව එකඟ වන්නේ නම්, කලින් කලට ගනුදෙනුවට අදාල එවැනි තොරතුරු අනුමත කිරීම හෝ අවශ්‍යතාවය මත ඔහු/ඇය (වෙළෙන්දා) විසින් ඒවා එවැනි විධියකින් සහ ආකාරයකින් එවැනි සකස් කිරීමේ පහසුකමකට අනුව ඉදිරිපත් කළ යුතු ය.**

**12.2 මුදල් ආපසු ගෙවීම්**

**(අ) යම් ගනුදෙනුවක් උදෙසා, යම් භාණ්ඩයක් ගනුදෙනුකරුට නොලැබීම ඇත්නම් හෝ නීත්‍යානුකූලව ප්‍රතික්ෂේප කර ඇත්නම් හෝ ආපසු ලබාදීම පිණිස භාරගෙන ඇත්නම් හෝ සේවාවන් ඉටුකර නැත්නම් හෝ අවලංගු කර ඇත්නම් හෝ කාඩ්පත දරන්නා විසින් මිළ වෙනුවෙන් නීත්‍යානුකූලව ආරවුල් කර ඇත්නම් හෝ මිළ ගැලපීමක් සඳහා අවසර ලබාදී ඇත්නම්, වෙළෙන්දා විසින් මුදල් ආපසු ලබානොදිය යුතු අතර, එහෙත් බැංකුව විසින් සපයා ඇති හෝ අනුමත කර ඇති බැර තුණ්ඩුවක් ඔහු/ඇය විසින් සම්පූර්ණ කළ යුතු ය. වෙළෙන්දා විසින් එක් එක් බැර තුණ්ඩුව අත්සන් කොට දින සඳහන් කළ යුතු අතර, අදාල භාණ්ඩ පිළිබඳ කෙටි විස්තරයක් එහි ඇතුළත් කළ යුතු ය. බැර තුණ්ඩුවේ සත්‍ය සහ සම්පූර්ණ කරන ලද පිටපතක් ගනුදෙනුකරුට ලැබෙන්නට සැලැස්විය යුතුය, හෝ යැවිය යුතු ය.**

(ආ) ගනුදෙනු වෙත යම් මුදල් ආපසු භාරදීමක් සිදුකරනු ලබන අවස්ථාවක, වෙළෙන්දා විසින් තැන්පත් තුණ්ඩුවක් සම්පූර්ණ කොට ("බැර" යන වචනය සඳහන් කොට) අදාල බැර තුණ්ඩු සම්පූර්ණ වශයෙන් අමුණා එකී ලියකියවිලි, මුදල් ආපසු ලබාදීමට එකඟවීමට වෙළෙන්දා සහ ගනුදෙනුකරු අතර ඇතිකරගත් දිනට පසුව වැඩකරන දින හතක් (7) ඇතුළත බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය. වහාම ක්‍රියාත්මක වන පරිදි වෙළෙන්දා විසින් ශුද්ධ උත්පාදන ((එනම් වට්ටම් මුදලින් සම්පූර්ණ බැර අඩු කිරීම (the total credit-less the discount)) බැංකුව වෙත ආපසු ගෙවිය යුතු ය.

(ඇ) දෙන ලද ඕනෑම වේලාවක බැර තුණ්ඩු පමණක් බැංකුව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක, එම අවස්ථාවේදීම වෙළෙන්දා විසින් ශුද්ධ ආපසු ගෙවීම (එනම්, ගනුදෙනුකරු/ගනුදෙනුකරුවන් සඳහා සම්පූර්ණ ආපසු ගෙවීම/ගෙවීම්වලින් වට්ටම් මුදල අඩුකිරීම වේ) බැංකුව වෙත ගෙවිය යුතු ය

**12.3** යම් ගනුදෙනුවක තොරතුරක් ඉදිරිපත් කිරීම මගින් (මෙම ගිවිසුමේ කාර්යය පිණිස යනුවෙන් යම් විකුණුම් තුණ්ඩුවක් සහ/හෝ වෙළෙන්දා හෝ ඔහු/ඇය වෙනුවෙන් යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන යම් තොරතුරක් හෝ ලේඛන අදහස් වේ) වෙළෙන්දා බැංකුව සමඟ එකඟ වෙමින් පහත පරිදි ඇප වේ.

(අ) එහි අඩංගු සියලුම පරිසිද්ධි විස්තර, සංඛ්‍යා සහ ගණනය කිරීම් වෙළෙන්දාගේ හොඳම දැනුමේ හැටියට සත්‍ය සහ සම්පූර්ණ ඒවා බවටත්,

(ආ) ගනුදෙනුවේ තොරතුරුවලට සහ එහි දැක්වෙන වටිනාකමට අදාල භාණ්ඩ සහ/හෝ සේවාව එකී මිළට වඩා වැඩි නොවන මිළකට සහ එකී නියමයන්ට නොඅඩු අනුකූලතාවයකින් වන නියමන් මත එවැනි භාණ්ඩ සහ/හෝ සේවාවන් වෙළෙන්දා විසින් මුදලට සපයා හෝ සැපයීමේ අභිප්‍රායෙන් සිටින බවටත්,

(ඇ) ගනුදෙනුවේ තොරතුරුවලට අදාල භාණ්ඩ සහ/හෝ සේවාවන් වෙනුවෙන් වෙනත් විකුණුම් තුණ්ඩු හෝ ගනුදෙනු විස්තර නිකුත් කර නොමැති හෝ නිකුත් නොකරනු ලබන හෝ ඉදිරිපත් නොකරනු ලබන බවටත්,

(ඈ) ගනුදෙනුවේ තොරතුරුවලට අදාල භාණ්ඩ සහ/හෝ සේවාවන් සැපයීම සඳහා වන ණය ප්‍රතිපාදන නීත්‍යානුකූල වන බවටත්, සහ

(ඉ) ගනුදෙනුවේ තොරතුරු, ගනුදෙනුවට අදාල වන බවටත්, වෙළෙන්දා මෙම ගිවිසුමට අනුකූලව කටයුතු කර ඇති බවටත් ය.

**12.4** යම් ගනුදෙනු තොරතුරක් බැංකුව විසින් භාරගැනීම හෝ, බැංකුව විසින් සිදුකරනු ලබන යම් ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් හෝ බැංකුවේ ප්‍රමාද දෝෂයකින් (බැංකුව විසින් විශේෂ ලිඛිත පිළිගැනීමක් හෝ එයින් සංත්‍යාංජනයක් හැර) යන දෙකින් එකක්වත් ඉහත **12.3** ඡේදයේ නියම වශයෙන් සඳහන් කොට ඇති පොරොන්දු හෝ මෙම ගිවිසුමේ යම් වෙනත් ප්‍රතිපාදනයන් සමඟ සංස්ථාපනය විය යුතු හෝ සංස්ථාපනයවීමට අනුභනයවිය යුතු, යම් පිළිගැනීමක් හෝ අනුකූලවීමක් සත්‍යාංජනය විය යුතු ය.

**13.** ගෙවීම්

**13.1** මෙම ගිවිසුමේ නියමයන්ට යටත්ව, ක්‍රියාවේ යොදවන ලද සහ දෙපාශර්වයම විසින් පිළිගනු ලැබූ සියලුම කාඩ්පත් ගනුදෙනු සඳහා වට්ටම් මුදල අඩුවෙන් හෝ යම් වෙනත් එකඟවූ වාර ගණනක සිදුවූ එක් එක් ගනුදෙනුවේ වටිනාකම බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය විසින් විකුණුම් තුණ්ඩු/ඉලෙක්ට්‍රෝනික ප්‍රේෂණය කිරීම් විස්තර ලැබූ දිනට පසුදින සිට ව්‍යාපාර දින හතක් (7) ඇතුළත බැංකුව විසින් වෙළෙන්දාට ගෙවිය යුතු ය.

**13.2** වෙළෙන්දා සඳහා වන ශුද්ධ ගෙවීම්, වෙළෙන්දා විසින් නම් කරන ලද බැංකුවේ තිබෙන වෙළෙන්දාගේ ගිණුමට ("වෙළඳ ගිණුම") හෝ වෙළෙන්දා විසින් ලිඛිතව නම් කරන ලද බැංකුවට බැංකුව විසින් ගෙවිය යුතුය.

**13.3** බැංකුව විසින් සිදුකරනු ලබන ගෙවීම්, වෙළෙන්දාට එදිරිව බැංකුවට තිබෙන යම් හිමිකම් හෝ අයිතිවාසිකම්වලට අගති රහිතව සිදුකළ යුතු අතර, මෙම ගිවිසුම යටතේ වන එහි බැඳීම් වශයෙන් වෙළෙන්දා විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සහ වෙළෙන්දා වෙත කළ යුතු ගෙවීම්වලදී කිසිදු පිළිගැනීමක් බැංකුව විසින් සංස්ථාපනය නොකල යුතු ය.

**13.4** පහත දැක්වෙන කරුණුවලට යටත්ව වෙළෙන්දා වෙත ගෙවිය යුතු යම් ගෙවීමක් හිලව් කොට අඩු කිරීමට බැංකුවට හිමිකම ඇත.

(අ) ඉහත 12 වෙනි ඡේදයේ දක්වා ඇති මුදල් ආපසු ගෙවීමේ කාර්යපටිපාටියට අනුකූලව කාඩ්පත දරන්නෙකු වෙත ආපසු ගෙවිය යුතු යම් මුදලක් සමඟ, සහ

(ආ) ගණිතමය දෝෂයක් හෝ වෙනත් හේතුවක් මත බැංකුව විසින් වැඩිපුර ගෙවා ඇති යම් මුදලක් සමඟ, හෝ

(ආ) වෙළෙන්දාගෙන් බැංකුවට හිඟව පවතින හෝ ඔහු/ඇය විසින් බැංකුව වෙත ගෙවිය යුතු මෙහි දක්වා ඇති යම් වෙනත් මුදලක් සමඟ , හෝ

(ඇ) බැංකුවේ අභිමතය පරිදි, කාඩ්පත දරන්නන්ගේ ණයගැතිභාවය සම්බන්ධයෙන් පවතින අනුපාත මත හිඟව පවතින දින සිට ගෙවීම සිදුකරනු ලබන දින දක්වා ඔවුන්ගෙන් අයකරනු ලබන පොලී මුදලට සමාන මුදලක් (එසේම යම් ඉල්ලීමක් සිදුකිරීමට පෙර/පසුව හෝ තීන්දුවක් ලැබීමට පෙර/පසුව) මෙම ගිවිසුම යටතේ අවශ්‍ය කරනු ලබන පරිදි එහෙත් ඉදිරිපත් කර නොමැති වෙළෙන්දා සහ කාඩ්පත දරන්නා අතර එකඟවී ඇති පරිදි මුදල් ආපසු ලබාදී දින හතකට (7) පසුව හෝ එවැනි කාලපරිච්ඡේදයක් තුළ බැංකුවේ නමින් ලියා ඇති චෙක්පතක් මගින් එහි දැක්වෙන සම්පූර්ණ මුදල සහිතව (එකී හත්වෙනි දිනය, එවැනි පොලී මුදලක් ගණනය කිරීමේ කාර්ය පිණිස නියමිත දිනය වශයෙන් ගෙන) යම් බැර තුණ්ඩුවක විස්තරවන මුදල මත බැංකුව වෙත යවා නොමැතිවිට පහත කරුණුවලට යටත්ව බැංකුව විසින් කටයුතු කරනු ඇත.

**(i)** වහාම වෙළෙන්දාගේ ගිණුමට හර කිරීම, සහ/හෝ

**(ii)** තදනන්තර බැරවලින් හිඟව පවතින මුදල වෙළෙන්දාගේ ගිණුමට අඩු කිරීම, සහ/හෝ

**(iii)** ගිණුමක් නොමැති නම් හෝබැංකුවේ පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක ප්‍රමාණවත් මුදලක් නොමැති නම්, වෙළෙන්දා විසින් නම් කරනු ලබන බැංකුවක් වෙත සෘජු හරකිරීමක් ආරම්භ කිරීමට හෝ ඔහු/ඇය විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට හර කිරීමට බැංකුවට බලය ලබාදිය යුතු ය. හිමිකම් කියනු ලබන මුදලට අමතරව, කාඩ්පත දරන්නන්ගේ ණයගැතිභාවය සම්බන්ධයෙන් පවතින අනුපාත මත හිඟව පවතින දින සිට පොලී මුදලට සමාන මුදලක් බැංකුවේ අභිමතය පරිදි අයකර ගත යුතු ය.

**13.5** බැංකුවට හෝ යම් කාඩ්පත් දරන්නෙකුට විරුද්ධව වෙළෙන්දා වංක සම්මතයෙන් හෝ වංචාසහගතව ක්‍රියා කරමින් මෙම ගිවිසුම උල්ලංඝණය කර ඇති බවට සාධාරණ හේතුවක්/හේතු සහිතව බැංකුව සැක කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට යටත්ව වෙළෙන්දා සඳහා වන සියලුම ගෙවීම් අත්හිටුවීමට මෙම ගිවිසුමට අනුව බැංකුවට අයිතියක් තිබිය යුතු ය.

**14.** කාඩ්පත් දරන්නන් සඳහා අයකිරීම්

කිසිදු කාඩ්පත් දරන්නෙකු සඳහා අධිභාර ගෙවීම, වට්ටම් මුදලින් කොටසක් ගෙවීම, යම් මිළ වැඩිවීමක් හෝ වෙනත් හැටියකින් කුමක් වුවද, කාඩ්පත භාවිතා කරමින් සිදුකරනු ලබන ගනුදෙනුවකට අදාලව යම් සමකාලීන මුල්‍ය ගාස්තු වෙළෙන්දා විසින් සිදුනොකළ යුතු ය.

**15.** නැවත අයකිරීම **(Chargeback)**

**15.1** වෙළෙන්දා වෙත කළ යුතු ගෙවීමකින් කොටසක් හෝ සම්පූර්ණ මුදලම ඕනෑම අවස්ථාවක ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට හිමිකම තිබිය යුතු අතර, හෝ ගෙවීම සිදුකර ඇත්නම්, එවැනි මුදලක් වෙළෙන්දාගේ ගිණුමට හර කිරීමට හෝ ඉක්මනින්ම ප්‍රතිපූරණය කරන ලෙසට වෙළෙන්දාගෙන් ඉල්ලා සිටිය හැක. එසෙකුදු වුවත්, මේ සඳහා පහත දැක්වෙන ඕනෑම තත්ත්වයක් යටතේ බැංකුව විසින් වෙළෙන්දා වෙත ලබාදී ඇති ඕනෑම බලය ලබාදීමක් සහ/හෝ බලය ලබාදීමේ සංකේත අංක අදාල වේ.

අ. කිසියම් හේතුවක් මත බැංකු ගනුදෙනුව නීතිවිරෝධී හෝ ක්‍රියාත්මක කළ නොහැකි විටෙක,

ආ. කාඩ්පත දරන්නාගේ අත්සන අවශ්‍ය අවස්ථාවකදී එය නොමැති විටෙක,

ඇ. ගනුදෙනුවකට අදාලව විකුණුම් තුණ්ඩුවක් හෝ ණයපත් තුණ්ඩුවක් හෝ යම් වෙනතත් ලේඛනයක් මත කාඩ්පත දරන්නා/ගනුදෙනුකරු විසින් ව්‍යාජ ලෙස අත්සන් කර ඇතිවටෙක හෝ ගනුදෙනුවව සඳහා භාවිතා කරනු ලැබූ කාඩ්පතෙහි වූ අත්සන සමඟ ලේඛන නොසැසෙඳෙන විටෙක,

ඇ. බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන ගනුදෙනුවකට අදාලව විකුණුම් තුණ්ඩුවේ පිටපත හෝ අවසාන ලදුපත හෝ යම් වෙනත් ලේඛනයක් ගනුදෙනුකරු විසින් අත්සන් කළ යුතු හෝ වෙළෙන්දා භාරයේ තිබෙන එවැනි ලේඛනයක් ගනුදෙනුකරු වෙත සපයා ඇති යම් පිටපතක් සමඟ අනනුකූල වන විටෙක,

ඉ. කාඩ්පත දරන්නාගේ ගිණුම් අංකය මගහැර ඇති බවට, අසම්පූර්ණ හෝ අවලංගු වී ඇති හෝ කාඩ්පත දරන්නාගේ ගිණුම් අංකය මුද්‍රණය කර නොමැති බවට සොයාගත් විටෙක,

ඊ. ගනුදෙනුවක් වෙනුවෙන් වෙළෙන්දා වෙත ඉදිරිපත් කරනු ලබන කාඩ්පත වෙනස්කර ඇති හෝ ඒ වනවිටත් වලංගු තත්ත්වයේ නොතිබෙන හෝ ගනුදෙනුව සිදුකරනු ලබන අවස්ථාව වනවිට එය කල් ඉකුත්වී ඇති විටෙක,

උ. ගනුදෙනුවක් වෙනුවෙන් වෙළෙන්දා වෙත ඉදිරිපත් කරනු ලබන කාඩ්පත, බැංකුව විසින් සහ ඒ වෙනුවෙන් වෙළෙන්දා වෙත කලින් කලට නිකුත් කරනු ලබන හෝ තබා ඇති අවවාදාත්මක ලැයිස්තුවෙහි හෝ යම් වෙනත් නිවේදනයක හෝ උපදේශයක (ඕනෑම ආකාරයක) ලැයිස්තුගත කර ඇති විටෙක,

ඌ. ගනුදෙනුකරුගෙන් අයකර ගනු ලබන මිළ, වෙළෙන්දා විසින් මුදලට සපයා ඇති සහ සපයනු ලබන භාණ්ඩවල හෝ ඉටුකරනු ලබන සේවාවන්වල මිළට වැඩියෙන් පවතින විටෙක,

එ. විකුණුම් මිළ, අවම මිළට වැඩියෙන් පැවති සහ ඒ සම්බන්ධයෙන් පූර්ව අවසරය බැංකුවෙන් ලබානොගෙන ඇති විටෙක,

ඒ. ගනුදෙනුවෙන් ආවරණය වන භාණ්ඩ සහ/හෝ සේවාවන් ප්‍රතික්ෂේප කර හෝ ආපසු ලබාදී හෝ ගනුදෙනුව හෝ එයින් කොටසක් වලංගු ලෙස කපා හැර ඇති හෝ කාඩ්පත දරන්නෙකු විසින් අවසන් කර ඇති අවස්ථාවක කාඩ්පත දරන්නා වෙත භාණ්ඩ සහ/හෝ සේවාවන් ඔහුගේ/ඇයගේ තෘප්තියට අනුව සැපයීමට වෙළෙන්දා විසින් කොහෙත්ම අසමත් වී ඇති විටෙක,

ඔ. විකුණුම් තුණ්ඩුව හෝ ණය පත් තුණ්ඩුව හෝ එයින් යම් කොටසක් කියවිය නොහැකි, අසම්පූර්ණ හෝ අත්සන් නොකොට ඇති විටෙක හෝ ඒවා මෙම ගිවිසුමට අනුකූලව පිළියෙල කර හෝ සම්පූර්ණ කර හෝ ඉදිරිපත් කර නොමැති විටෙක,

ඕ. මෙම ගනුදෙනුවෙන් ආවරණය කරනු ලබන භාණ්ඩ සහ/හෝ සේවාවන්හි ස්වභාවය, ගුණාත්මක භාවය හෝ ප්‍රමාණය සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා වාද කරනු ලබන විටෙක,

ක. ගනුදෙනුව වෙනුවෙන් බැංකුව වෙත ඉලෙක්ට්‍රෝනිකව ඉදිරිපත් කරනු ලබන යම් තොරතුරත් කලින් කලට බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව නොලැබී ඇති විටෙක,

ග. 21 වෙනි වගන්තියට අනුකූලව වෙළෙන්දා විසින් සැපයීමට අපොහොසත් වූ ගනුදෙනුවට අදාල සාක්ෂි බැංකුව විසින් ඉල්ලා ඇති විටෙක,

ජ. එකී ගනුදෙනුවට අදාලව මෙම ගිවිසුමේ නියමයන්ගෙන් යම් අපගමනයක් සිදුව ඇති විටෙක,

ට. 11 වෙනි වගන්තියේ දැක්වෙන පරිදි ගනුදෙනුවට අදාලව සහ ගනුදෙනුව වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු යැයි ඉල්ලා ඇති තොරතුරු ගනුදෙනුව සිදුවී දින හතක් (7) ඇතුළත බැංකුවට ඉදිරිපත් කර නොමැති විටෙක,

ඩ. ගනුදෙනුව සිදුකිරීම හෝ ගනුදෙනුව මගින් ආවරණය වන භාණ්ඩ සහ/හෝ සේවාවන් භාරදීම සම්බන්ධයෙන් කාඩ්පත දරන්නා යුක්තිසහගත ලෙස වාදකර හෝ ප්‍රතික්ෂේප කර ඇති විටෙක,

න. ගනුදෙනුව සිදුකිරීම සඳහා බලය ඉල්ලීමේදී, වෙළෙන්දා විසින් කාඩ්පත දරන්නාගේ නම හෝ කාඩ්පත් ගිණුම් අංකය වැරදි ලෙස බැංකුව වෙත ලබාදී ඇති විටෙක,

ත. ගනුදෙනුව හෝ විකුණුම් තුණ්ඩුව හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් මෙම උපවගන්තියේ වඩාත් විශේෂ කොට දක්වා ඇති උල්ලංඝණය කිරීම් හැර වෙළෙන්දා විසින් මෙම ගිවිසුම උල්ලංඝණය කර ඇති විටෙක,

ද. වෙළෙන්දා විසින් වැරදි විකුණුම් තුණ්ඩුවක පිටපතක් තැන්පත් කිරීම හේතුකොට ගෙන ගනුදෙනුව කාඩ්පත දරන්නාගේ ගිණුමට එක් වතාවකට වඩා වැඩි වාර ගණනක් ඇතුළත් කර ඇති විටෙක,

ණ. ගනුදෙනුව අක්‍රමවත් බවට බැංකුව සාධාරණ ලෙසින් විශ්වාස කර ඇති විටෙක,

ප. ගනුදෙනුව වටා සැකසහිත තත්ත්වයන් ඇති බවට බැංකුව සාධාරණ ලෙසින් විශ්වාස කර ඇති විටෙක,

බ. ඉදිරිපත් කිරීම සාමාන්‍ය ආකාරයෙන් බැහැරව සිදුකර ඇති බවට බැංකුව සාධාරණ ලෙස විශ්වාස කර ඇති විටෙක,

ම. වෙළෙන්දා විසින් ඉදිරිපත් කර ඇති විකුණුම් තුණ්ඩුව නිකුත් කිරීමේ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර ඇති විටෙක,

ය. ගනුදෙනුව සිදුකරනු ලැබූ දින යම් වෙනත් සිදුවීමක් හෝ ලියවිල්ලක් ඇති විටෙක,

ර. මෙහි 5.1 සහ 5.2 වෙනි වගන්තිවල දැක්වෙන ප්‍රතිපාදනයන් එසේ තිබියදීත්, ගනුදෙනුවේ ස්වභාවයන් එතරම් සැකසහිත විටෙක එනම් කාඩ්පත ව්‍යාජ ලෙස සකස් කරන ලද හෝ සොරකම් කරන ලද එකක් බවට වෙළෙන්දා විසින් අවබෝධ කරගෙන ඇති සහ එසේ හෙයින් ගනුදෙනුව ප්‍රතික්ෂේප කළ යුතුව පවතින විටෙක වේ.

**15.2** **15 වෙනි වගන්තිය යටතේ නැවත අයකර ගැනීමේ (Chargeback) අයිතියේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවට ගෙවිය යුතු මුදල ගෙවන ලෙස බැංකුව විසින් ඉල්ලා ඇති විටෙක වෙළෙන්දා ඊට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක, මෙම වෙළඳ ගිවිසුමේ 13.4 වෙනි වගන්තියේ විශේෂ කොට දක්වා ඇති පරිදි නැවත අයකර ගැනීමේ (Chargeback) මුදල හිලව් කිරීමට සහ/හෝ අඩුකිරීමට බැංකුවට අයිතියක් ඇත.**

**16.** වෙළෙන්දාගේ නම භාවිතා කිරීම

**16.1** **කාඩ්පත් භාරගැනීමට අදාලව සාදන ලද යම් ප්‍රවධර්න මුතර් නාමාවලියකට (මුද්‍රිත මාධ්‍ය, සමාජ මාධ්‍ය, ඉලෙක්ට්‍රෝනික මාධ්‍ය ආදියද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී) වෙළෙන්දාගේ නම ඇතුළත් කිරීමට ඔහු/ඇය ස්ථිර ලෙසම බැංකුවට අවසර ලබා දේ.**

**16.2** **16.1 වගන්තියේ විශේෂ කොට දක්වා ඇති පරිදි ප්‍රවධර්න ක්‍රියාකාරකම් සිදුකිරීම වෙනුවෙන් පාශර්යවයන් අතර එකඟවිය යුතු බැංකුවට අදාල අලෙවි ගාස්තු වෙළෙන්දා විසින් ගෙවනු ලබන බවට ඔහු/ඇය එකඟ වේ.**

**17.** සංකේත සහ ගෙවුම් සමාගම්වල නම් ප්‍රදශර්නය කිරීම

**වෙළෙන්දාගේ ව්‍යාපාරික ස්ථානයේ/ස්ථානවලදී ගෙවුම් සමාගම/සමාගම් ගරු කරනු ලබන බව මහජනතාවට දැනුම්දීම සඳහා අදාල ගෙවුම් සමාගමේ/සමාගම්වල වතර්මාන සංකේත සහ නම් මෙන්ම ප්‍රවධර්න ද්‍රව්‍ය වෙළෙන්දා විසින් ප්‍රදශර්නය කළ යුතු ය. ගෙවුම් සමාගමේ/සමාගම්වල සංකේත සහ නම් භාවිතා කිරීමට හෝ ප්‍රදශර්නය කිරීමට වෙළෙන්දාට තිබෙන අයිතිය අඛණ්ඩව පවතිනු ඇත්තේ වෙළඳ ගිවිසුම බලාත්මකව පවතින තාක් කල් සහ එය අවසන්** (exterminated) කරනු ලබන තෙක් හෝ භාවිතා කිරීම සහ ප්‍රදර්ශනය කිරීම වෙළෙන්දා විසින් නතර කළ යුතු බවට එවැනි ගෙවුම් සමාගමක්/සමාගම් සහ/හෝ බැංකුව විසින් සාමාජිකයාට දැනුම්දෙනු ලබන තෙක් පමණි.

**18.** වෙළඳ වට්ටම් මුදල

**වෙළඳ වට්ටම් අනුපාතය සම්බන්ධයෙන් බැංකුව විසින් කලින් කලට උපදෙස් දිය යුතු ය.**

**19.** අවම සීමාව

**අවම සීමාව/සීමාවන් සම්බන්ධයෙන් බැංකුව විසින් කලින් කලට උපදෙස් දිය යුතු ය.**

**20.** ගාස්තු සහ අයකිරීම්

**20.1** **මෙම ගිවිසුමේ කොටසක් ((ඇමුණුම දෙක (02)) ලෙස තිබෙන ගාස්තු ව්‍යුහයේ විශේෂ කොට දක්වා ඇති ගාස්තු සහ අයකිරීම් වෙළෙන්දා විසින් ගෙවිය යුතු ය.**

**20.2** **ඇමුණුම දෙකෙහි (02) දක්වා ඇති අවම විකුණුම් ධාරිතා ඉලක්කය/ඉලක්ක මාසිකව හෝ මාසයේ අවසාන දින හෝ ඊට පෙර එකතු කරනු ලබන බවට වෙළෙන්දා වගබලාගත යුතු ය. වෙළෙන්දා අවම ඉලක්කය/ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වන අවස්ථාවක ගිවිසුමේ දක්වා ඇති පරිදි අනුගාමී ගාස්තුව/ගාස්තු වෙළෙන්දා විසින් බැංකුවට ගෙවිය යුතු ය.**

**21.** අවම ගනුදෙනු මුදල

**21.1** **ඔවුන්ට අවශ්‍ය කරනු ලබන, වෙනත් හැටියකින් වෙළෙන්දා විසින් වලංගු කාඩ්පත්වලට ගරු කිරීම ප්‍රතික්ෂේප කළ යුතු වන ආකාරයේ මුදලකට වඩා පහළ වටිනාකමකින් යුත් ගනුදෙනුවක් සිදු කරන ලෙසට වෙළෙන්දා විසින් ඉල්ලා සිටීම හෝ අත්සන් නොකළ යුතු ය.**

**21.2** **මෙහි ඇමුණුම දෙක හි (02) විස්තර කර ඇති පරිදි වෙළෙන්දා විසින් අවම ඉලක්ක ගාස්තුව බැංකුවට ගෙවිය යුතු ය.**

**22.** ගිවිසුම් උල්ලංඝනය කිරීම

මෙම ගිවිසුමේ දැක්වෙන යම් නියමයක් වෙළෙන්දා විසින් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක එහි 31 වෙනි වගන්තිය යටතේ බැංකුවේ අයිතීන්ට අගති රහිතව එය අවසන් කිරීමේදී වෙළෙන්දාගේ ගිණුමට හර කිරීමට හෝ ඔහු/ඇය හිමිකම් කියනු ලබන යම් මුදල් ආපසු දීමක් අඩු කිරීමට බැංකුවට බලය ඇත. බැංකුවේ ගිණුමක් නොමැති නම් හෝ හිමිකම් කියනු ලැබූ යම් මුදල් ආපසු දීමක් සඳහා ප්‍රමාණවත් මුදලක් එහි නොමැති නම් හෝ බැංකුවට හානිපූරණය කිරීමට තැන්පතුව ප්‍රමාණවත් නොවන්නේ නම්, වෙළෙන්දා විසින් නම් කරනු ලැබූ ඍජු හර කිරීමක් ආරම්භ කිරීමට හෝ ඔහු/ඇය විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමක් හර කිරීමට බැංකුවට අවසර ලබාදිය යුතු ය. හිමිකම් කියනු ලබන මුදලට අමතරව, නියමිත දින සිට කාඩ්පත් දරන්නන්ගේ ණයගැතිභාවය වෙනුවෙන් මේ වනවිට ඔවුන්ගෙන් අයකරනු ලබන අනුපාතය මත පොලී මුදලට සමාන මුදලක් බැංකුවේ අභිමතය පරිදි අයකරගනු ඇත.

**23.** සාක්ෂි සහ ලේඛන

**23.1** ගනුදෙනු කරනු ලබන ඕනෑම මුදලක් (එහෙත් යට කී කරුණුවලට අගති රහිතව) සමඟ කාඩ්පත දරන්නාගේ ගිණුම සඳහා හර කළ යුතු කාඩ්පත දරන්නාගේ අවසර ලබාදීමට අදාල බැංකුවට සෑහීමට පත්විය හැකි සාක්ෂි බැංකුවේ ඉල්ලීම මත වෙළෙන්දා විසින් ඉක්මනින්ම ඉදිරිපත් යුතු ය. එක් එක් ගනුදෙනුවට අදාළ ලේඛන සහ වාතර්‍ා අවුරුදු එකකට (1) නොඅඩු කාලයක් වෙළෙන්දා භාරයේ තබාගත යුතු අතර, ඉන් පසුව ඒවා ඉල්ලා සිටින අවස්ථාවලදී බැංකුවට ඉදිරිපත් කළ යුතු ය.

**23.2** බැංකුව විසින් කලින් කලට ඉල්ලා සිටිනු ලබන පරිදි යම් ගනුදෙනුවකට අදාල වංචාකාරී ක්‍රියාවක් අනාවරණය කරගැනීමට සහ එය වැලැක්වීම පිණිස අවශ්‍ය කරනු ලබන යුක්තිසහගත වූ සහයෝගය වෙළෙන්දා විසින් බැංකුවට ලබාදිය යුතු ය.

**24.** උපකරණ සහ/හෝ මුද්‍රණය/මුද්‍රණ

**24.1** (අ) බැංකුව විසින් සපයා ඇති වෙළෙන්දා සතුව පවතින සියලුම උපකරණ සහ ද්‍රව්‍ය (මෙම ගිවිසුම යටතේ අවශ්‍ය ආවරණය නොකරනු කරනු ලබන උපකරණ සහ ද්‍රව්‍ය හැර) ඔහුගේම/ඇයගේම භාවිතය පිණිස ඔහු/ඇය භාරයේ තබාගනු ඇත. එකී උපකරණ සහ ද්‍රව්‍ය හොඳ තත්ත්වයෙන් නඩත්තු කරන බවට වෙළෙන්දා වගබලා ගත යුතු ය.

(ආ) උපකරණ සුරක්ෂිතව තබාගෙන පාලනය කිරීම වෙළෙන්දාගේ තනි වගකීම වේ. සියලුම උපකරණ භාවිතා කිරීම, වෙළෙන්දා වෙළෙන්දාගේ අවසරය සහ අනුමැතිය යටතේ සිදුවිය යුතු බවට සැලකිය යුතු ය.

(ඇ) බැංකුව සහ වෙළෙන්දා අතර පරිදි, උපකරණ භාවිතා කරනු ලබන සියලුම පුද්ගලයින් වෙළෙන්දාගේ නියෝජිතයින් බවට සැලකිය යුතු අතර, වෙළෙන්දා සහ නියෝජතයින් හෝ ගනුදෙනුකරුවන් අතර ඇතිවිය හැකි ඕනෑම ආකාරයේ ආරවුල්සහගත තත්ත්වයකට බැංකුව වගනොකියනු ඇත. උපකරණ භාවිතා කිරීම හෝ ඒවා වැරදිසහගත ලෙස භාවිතා කිරීම හේතුකොට ගෙන බැංකුවට විඳීමට හෝ දැරීමට සිදුවිය හැකි ඕනෑම ආකාරයක හිමිකම්, පාඩු, ඉල්ලීම්, ක්‍රියාමාගර්, බරපැන හෝ වියදම්වලදී වෙළෙන්දා විසින් බැංකුව නිදහස් කළ යුතු ය.

(ඈ) වෙළෙන්දා වෙත සපයා ඇති ඕනෑම උපකරණයක් බැංකුවේ දේපළක් ලෙස පැවතිය යුතු අතර, ඉල්ලා සිටිනු ලබන අවස්ථාවලදී ඒවා බැංකුවට භාරදිය යුතු ය.

(ඉ) උපකරණ භාවිතා කිරීමේදී සිදුවිය හැකි වංචා වැලැක්වීමට සහ ඒවා අනාවරණය කරගැනීමට අවශ්‍ය කරනු ලබන යුක්තිසහගත සහාය බැංකුව විසින් වෙළෙන්දාට ලබාදෙනු ඇත.

(ඊ) උපකරණවල පිරිවැය සහ/හෝ ඒවා අවිධිමත් ලෙස භාවිතා කිරීම හේතුවෙන් සිදුවන හානි වෙනුවෙන් දැරීමට සිදුවන වියදම බැංකුව විසින් වෙළෙන්දාගෙන් අයකර ගනු ඇත.

(උ) සියලුම උපකරණ, මෙම ගිවිසුම අවසන් කිරීමත් සමඟම හෝ වෙළෙන්දා විසින් සිය ව්‍යාපාරය අවසන් කරන්නේ නම්/අවසන් කරනු ලබන අවස්ථාවක බැංකුවට ආපසු භාරදිය යුතු ය.

**24.2** (අ) උපකරණය විකිණීමට, මාරු කිරීමට, බද්දට දීමට හෝ වෙනත් හැටියකින් යෙදවීමට හෝ යෙදවීමට ප්‍රයත්න දැරීමට හෝ උපකරණය සමඟ යම් වෙනත් ගනුදෙනුවක් සිදුකිරීමට හෝ උපකරණය මත ඇතිකළ හැකි යම් පිළිබැඳීමක් ඇති කිරීමට වෙළෙන්දා විසින් කටයුතු නොකළ යුතු ය.

(ආ) උපකරණයට යා කොට ඇති යම් හඳුනාගැනීමේ සලකුණු, හැඳුනුම් සංකේත හෝ තහඩු හෝ උපකරණය බැංකුවට අයත් බැව් සඳහන් උපකරණයේ කොටසක් ඉවත් කිරීම, සැඟවීම හෝ වෙනස් කිරීම වෙළෙන්දා විසින් නොකළ යුතු ය.

(ඇ) මෙම ගිවිසුමට අනුව උපකරණය පරිශීලනය කිරීමට, නැවත භුක්තිය ලබාගැනීමට හෝ පවරා දීමට බැංකුවට තිබෙන අයිතිය හෝ වෙනත් හැටියකින් එහි පාලනය තුළ ගනුදෙනුකරුවෙකුගේ හෝ එහි සේවකයෙකුගේ හේ නියෝජිතයෙකුගේ යම් ක්‍රියාවක් මගින් ඕනෑම ආකාරයකින් අවහිර කිරීම හෝ උවදුරෙහි හෙළීම වෙළෙන්දා විසින් සිදු නොකළ යුතු ය.

**24.3** මෙහි **25** වෙනි වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදනයන්ට යටත්ව, අවශ්‍ය කරනු ලබන යම් සේවා කිරීමක්, අලුත්වැඩියා කිරීමක් හෝ ප්‍රතිස්ථාපනය කිරීමක් වෙනුවෙන් බැංකුව වගකිව යුතු ය. මෙකී කාර්ය පිණිස, යුක්තියුක්ත වන සෑම අවස්ථාවකදීම උපකරණයට ප්‍රවේශවීම සඳහා බැංකුවට, එහි කොන්ත්‍රාත්කරුවන්ට හෝ නියෝජිතයින්ට ඉඩදිය යුතු ය.

**24.4** බැංකුවේ පූර්ව ලිඛිත කැමැත්තක් නොමැතිව කිසිදු තුන්වන පාශර්වයකට උපකරණයේ නඩත්තු සේවා කටයුතු සිදුකිරීමට හෝ වෙනස්කම් සිදුකිරීමට, ක්‍රියාකාරිත්වය වැඩිකිරීමට හෝ ඉංජිනේරුමය වෙනස්කම් සිදුකිරීමට වෙළෙන්දා විසින් ඉඩ නොදිය යුතු ය.

**25.** ව්‍යාපාරය වෙනත් ස්ථානයකට රැගෙන යාම සහ අවසන් කිරීම

ව්‍යාපාරයට අයත් සාප්පු හෝ කාර්යාල යම් වෙනත් ස්ථානයකට රැගෙන යන්නේ නම් සහ ව්‍යාපාරය අවසන් කරන්නේ නම් එකී රැගෙන යනු ලබන හෝ අවසන් කරනු ලබන දිනට වැඩ කරන දින තිහකට **(30)** පෙර ඒ බැව් වෙළෙන්දා විසින් බැංකුවට දැන්විය යුතු ය.

**26.** අනාවරණය කිරීම්

වෙළෙන්දාගේ ගිණුමට හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට අදාල යම් තොරතුරක්, යම් පාශර්වයක් සඳහා වෙළෙන්දාගේ විස්තර සහ කටයුතු (මූල්‍යමය හෝ වෙනත් හැටියකින්) යම් පුද්ගලයෙකුට, සංස්ථාවකට, බැංකුවකට, මූල්‍ය ආයතනයකට, බැංකුවේ ශාඛාවලින් එකකට සහ අදාල සමාගම්වලට සහ යම් එවැනි පාශර්වයකින් තොරතුරු ලබාගැනීමද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී හෙළිකිරීමට වෙළෙන්දා විසින් බැංකුවට අවසර දිය යුතු ය.

**27.** අයිතිය අත්හැරීමේ ප්‍රකාශය

**27.1** බැංකුවේ දැඩි නොසැලකිල්ල සහ බැංකුව විසින් ඕනෑකමින් සිදුකරනු ලබන පැහැර හැරීමකදී හැර මෙකී සේවාවන් සම්බන්ධයෙන් බැංකුව විසින් සන්නිවේදනය කරනු ලබන යම් අලෙවි ලක්ෂ්‍ය බලයදීමක සාවද්‍යතාවය හෝ අවලංගුභාවය වෙනුවෙන් වෙළෙන්දාට හෝ වෙළෙන්දාගේ යම් පාරිභෝගිකයෙකුට කිසිදු වගකීමකට බැංකුව යටත් නොවන අතර, ඒ සම්බන්ධයෙන් හටගන්නා යම් හිමිකම්පෑම්වලින් බැංකුව නිදහස් කළ යුතු ය.

**27.2** මෙම ගිවිසුමෙන් විශේෂයෙන්ම සපයා ඇති පරිදි ප්‍රත්‍යාතිකව සිදුවන යම් කරුණක් හැර, පද්ධතියට අදාලව ඕනෑම ආකාරයකින් තිබෙන සියලුම නියමයන්, කොන්දේසි, පොරොන්දු, පෙළෙඹවීම් භාරගැනීම් හෝ නියෝජනය කිරීම් විශේෂ වුවත් නොවුවත්, ප්‍රතීයමානව, ව්‍යවස්ථාපිතව හෝ වෙනත් හැටියකින් බැහැර වේ. පූර්ව වාක්‍යයේ පොදු බවට සීමා නොවී, උපකරණය සම්බන්ධයෙන් හෝ උපකරණය ක්‍රියාවිරහිතවීමක් හෝ දෝෂයක්, එහි තිබෙන වැඩසහටන් දත්ත හෝ පද්ධතිය හේතුකොට ගෙන ඕනෑම ආකාරයකින් සෘජුව හෝ වක්‍රව සිදුවන හෝ දරනු ලබන පාඩු හෝ හානි (ආනුෂංගික පාඩු හෝ හානි) සම්බන්ධයෙන් බැංකුව වෙළෙන්දාට වගකියනු නොලැබේ.

**28.** වගකීමෙන් නිදහස්වීම

**28.1** පහත දක්වා ඇති කරුණුවලට අදාලව බැංකුවට සෘජුව හෝ වක්‍රව හටගන්නා විඳීමට හෝ දැරීමට සිදුවන යම් ක්‍රියාමාගර්, හිමිකම්, පිරිවැය, හානි, ඉල්ලීම්, වියදම්, පාඩු සහ සිදුකරනු ලබන වගකීම්වලින් වෙළෙන්දා විසින් බැංකුව නිදහස් වේ.

(අ) යම් හෙයකින් මෙම ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කිරීමට වෙළෙන්දා යම් අපොහොසත්වීමකදී සහ/හෝ,

(ආ) වෙළෙන්දා සහ කාඩ්පත දරන්නා අතර සිදුවන යම් ගනුදෙනුවක් ඇතුළුව එහෙත් ඉහත දක්වා ඇති කරුණුවලට අගති රහිතව යම් කාඩ්පත් දරන්නෙකුට (හෝ වෙළෙන්දාගේ යම් නිලධාරියෙකුට හෝ නියෝජිතයින්ට) කලැයි කියන යම් හෝ යම් වැරදි නියෝජනයක් හෝ කොන්ත්‍රාත්තුව උල්ලංඝනය කිරීමක් හෝ වෙළෙන්දා විසින් වෙනත් රාජකාරී උල්ලංඝනය කිරීමක්,

(ඇ) සියලුම ක්‍රියාමාගර්, හිමිකම්, ඉල්ලීම්, වගකීම්, බැඳීම්, පාඩු, වියදම්වලින් සහ ඒවාට විරුද්ධව බැංකුව විසින් හෝ බැංකුවට විරුද්ධව තජර්නයක් වී ඇති විඳිනු ලබන, දරනු ලබන හෝ දරා සිටින නෛතික ගාස්තු, වියදම් සහ දඩ මුදල් සහ පොලී මුදල්ද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී (i) වෙළෙන්දාගේ යම් නියාමක අවශ්‍යතා (ii) මෙම ගිවිසුමට අනුකූලව එයට ප්‍රදානය කර ඇති අයිතිවාසිකම් බැංකුව විසින් භාවිතා කිරීම හෝ (iii) මෙම ගිවිසුමේ දැක්වෙන නියමයන්ට අනුකූලව හැර වෙළෙන්දා විසින් බැංකු සේවාවන් භාවිතා කිරීම එනම් එහි බුද්ධිමය අයිතිවාසිකම්වලින් ඕනෑම එකක් තුන්වන පාශර්වයක් විසින් අවසරයක් නොමැතිව භාවිතා කිරීමක් හෝ උල්ලංඝනය කළ බවට සංස්ථාපනය කිරීමක්,

(ඈ) තහනම් කරන ලද යම් නිෂ්පාදනයක් අළෙවි කිරීමක් වේ.

**28.2** එවැනි යම් හිමිකමකට අදාල සියලුම වාතර්ා සටහන් සහ කතිකා පැවැත්වීමට සහ ඒ සම්බන්ධයෙන් භාර ගැනීමට, වාද කිරීමට, සාමයෙන් බේරා ගැනීමට හෝ වෙනත් හැටියකින් ගනුදෙනු කිරීමට බැංකුවට සම්පූණර් හිමිකමක් ඇතිවා මෙන්ම ඒ සම්බන්ධයෙන් වෙළෙන්දා වෙනුවෙන් කිසිඳු බැඳීමකට යටත්වීමට බැංකුවට සිදු නොවන අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන පරිදි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරනු ලබන සහාය වෙළෙන්දා විසින් බැංකුවට ලබාදිය යුතු ය.

**29.** රහස්‍යභාවය

**29.1** සිදුකළ යුතු යැයි නීතියෙන් බලය ලබාදීමකින් මිසක කාඩ්පත දරන්නාගේ පූවර් ලිඛිත කැමැත්ත නොමැතිව කිනම් ආකාරයකින් හෝ ලබාගන්නා ඔහුගේ/ඇයගේ ඕනෑම තොරතුරක් හෝ ගනුදෙනුවක් කිසිඳු තුන්වන පාශර්වයක් (ගනුදෙනුව සම්පූණර් කිරීමට හෝ බලාත්මක කිරීමට වෙළෙන්දාට සහාය දැක්වීමේ තනි කායර්ය පිණිස කටයුතු කරනු ලබන වෙළෙන්දාගේ නියෝජිතයින්ට හැර වෙළෙන්දාගේ රක්ෂණකරුවන් සහ වෘත්තීයමය උපදේශකයින්) විසින් භාවිතා කිරීම හෝ අනාවරණය කිරීම සිදු නොකළ යුතු ය.

**29.2** සිදුකළ යුතු යැයි නීතියෙන් බලය ලබාදීමකින් මිසක බැංකුවේ පූවර් ලිඛිත කැමැත්ත නොමැතිව කිනම් ආකාරයකින් හෝ ලබාගන්නා එහි ව්‍යාපාරික කටයුතුවලට හෝ පද්ධතියට හෝ මෙම ගිවිසුමට අදාල ඕනෑම තොරතුරක් කිසිඳු තුන්වන පාශර්වයක් (ගනුදෙනුව සම්පූණර් කිරීමට හෝ බලාත්මක කිරීමට වෙළෙන්දාට සහාය දැක්වීමේ තනි කායර්ය පිණිස කටයුතු කරනු ලබන වෙළෙන්දාගේ නියෝජිතයින්ට හැර වෙළෙන්දාගේ රක්ෂණකරුවන් සහ වෘත්තීයමය උපදේශකයින්) විසින් භාවිතා කිරීම හෝ අනාවරණය කිරීම සිදු නොකළ යුතු ය.

**30.** ගිණුම් අංකයේ තොරතුරු

**3.1** වෙළෙන්දාගේ ව්‍යාපාරික කටයුතුවලට සහාය දැක්වීමේ කායර්ය පිණිස කටයුතු කරනු ලබන වෙළෙන්දාගේ නියෝජිතයින්ට, එහි අත්පත් කරගන්නා සාමාජිකයින්ට, කාඩ්පතට හෝ රජයේ ඉල්ලීමක් මත හැර මුද්‍රිත අලෙවි තුණ්ඩු, මුද්‍රිත අලෙවි තුණ්ඩුවල කාබන් පිටපත්, තැපැල් ලැයිස්තු, ටේප් පටි හෝ කාඩ්පත් ගනුදෙනුවක් හේතුකොට ගෙන ලබාගන්නා අනිකුත් සන්නිවේදන ආකාරයෙන් කාඩ්පත දරන්නාගේ නම හෝ කාඩ්පත් ගිණුම් අංකයේ තොරතුරු කිසිඳු තුන්වන පාශර්වයක් වෙත විකිණීම, මිළදී ගැනීම, සැපයීම හෝ හුවමාරු කිරීම වෙළෙන්දා විසින් සිදු නොකළ යුතු ය.

**3.2** වෙළෙන්දා, දැනට බලාත්මකව පවතින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂක මාගෙර්ාපදේශද ඇතුළුව PCIDSS සහ අදාල රෙගුලාසි හෝ අනාගතයේදී බලාත්මක විය හැකි එවැනි ආරක්ෂක මාර්ගෝපදේශ සහ රෙගුලාසිවලට අනුගත විය යුතු ය.

**31. ගිවිසුමේ කාලය, අළුත් කිරීම, සංශෝධනය කිරීම සහ අවසන් කිරීම**

***31.1 ගිවිසුමේ කාලය***

පහත 31.3 හි දක්වා ඇති පරිදි මෙම ගිවිසුමට ඇතුළත් වූ පාශර්වයන් විසින් හස්තාංකනය කරනු ලැබූ දින සිට එය අවසන් කරනු ලබන දින තෙක් බලාත්මක වේ.

***31.2 ගිවිසුම අලුත් කිරීම සහ සංශෝධනය කිරීම***

දෙපාශර්වයේම ලිඛිත එකඟතාවයකින් මිසක මෙම ගිවිසුම වෙනස් කිරීම සහ/හෝ සංශෝධනය කිරීම සහ/හෝ එයට එකතු කිරීම සිදු නොකළ යුතු ය.

***31.3 ගිවිසුම අවසන් කිරීම***

(අ) පහත දැක්වෙන තත්ත්වයන් හේතුකොට ගෙන ගිවිසුමේ කාලය අවසන්වීමට පෙර ඕනෑම අවස්ථාවකදී බැංකුව විසින් එය අවසන් කළ හැකි ය.

- **(i)** මෙම ගිවිසුමේ නියමයන්ගෙන් ඕනෑම එකක් වෙළෙන්දා විසින් ද්‍රව්‍යාත්මකව උල්ලංඝනය කළහොත් එසැනින් එය බැංකුව විසින් අවසන් කළ හැකි ය.
- **(ii)** වෙළෙන්දා විසින් ජාත්‍යන්තර වශයෙන් සිදුකරනු ලබන වංචාවක්, ඔහුගේ/ඇයගේ දැඩි නොසැලකිල්ල හෝ ඔහු/ඇය විසින් සිතාමතා සිදුකරන ලබන විෂමාචාරයක් හේතුකොට ගෙන බැංකුවට හානියක් සිදුකළ හෝ ඉක්මනින්ම මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කළ හැකි ය.
- **(iii)** බංකොලොත්තු පටිපාටිකරය, ඒකාබද්ධ කිරීම හෝ ප්‍රතිනිමර්‍ාණය කිරීමේ කායර්ය පිණිස හැර අනිවායර් හෝ ස්වෙච්ඡා යන දෙකින් කොයික වුවත් ඈවර කිරීමට ආරම්භ කිරීම, එහි ණයහිමියන් සමඟ කටයුතු කිරීම සහ/හෝ හිඟව පවතින අවස්ථාවලදී එහි ණය ගෙවීමට සාමාන්‍යයෙන් නොහැකිවීම යන කරුණු වෙළෙන්දා විසින් සිදුකිරීම හේතුකොට ගෙන ඉක්මනින්ම මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කළ හැකි ය.

(ආ) උපකරණය නීතිවිරෝධී හෝ බලය නොලත් ක්‍රියාකාරකම් සහ/හෝ කායර්යන් පිණිස භාවිතා කරමින් පවතින බවට බැංකුවට දැනගැනීමට ලැබුණු වහාම කිසිඳු පූවර් දැනුම්දීමකින් තොරව බැංකුවේ පරම අභිමතය මත උපකරණය සඳහා ප්‍රවේශවීම අවලංගු කිරීම සහ/හෝ යම් හෙයකින් ප්‍රතිස්ථාපනයක් ඉල්ලා සිටියහොත් ප්‍රවේශය ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට බලය ඇත.

(ඇ) කෙසේ වෙතත් වෙළෙන්දා වෙත හුදෙක් දින 30 ක අත්හිටුවීමේ පූවර් දැනුම්දීමක් ලබාදීමෙන් මෙම ගිවිසුම අවසන් කිරීමේ අයිතිය බැංකුව සතුවන අතර, නැතහොත් එහි අභිමතය පරිදි වෙළෙන්දා මත සීමාකිරීම් තැබීමෙන් සාධාරණ හේතුවක් මත පූවර් දැනුම් දීමක් නොමැතිව වුවද මෙම ගිවිසුම අවසන් කළ හැකි ය.

(ඈ) මෙම ගිවිසුම අවසන් කිරීමට වෙළෙන්දා අදහස් කරන්නේ නම් හෝ බැංකුව වෙත ලබාදෙන ඕනෑම හේතුවක් මත මාස තුනක (03) ලිඛිත දැනුම්දීමක් සහිතව මෙම ගිවිසුම අවසන් කළ හැකි ය.

**31.4 ගිවිසුම අවසන් කිරීමෙන් සිදුවන බලපෑම්**

**31.4. (අ)**

- **i)** මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කිරීම, කරනු ලබන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් වන ගෙවීම් සහ ගිවිසුම අවසන් කරනු ලබන දිනට හෝ ඊට පෙර භාරගෙන තිබීම යන කරුණු විධිමත්ව සම්පූණර්වීම මත බැංකුවට අගති රහිතව සිදුකළ යුතු ය.
- **ii)** මෙම ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවේදී සම්පූණර් කරන ලද සියලුම ගනුදෙනු බැංකුවේ නියෝජිතයා වෙත වෙළෙන්දා විසින් එම වේලාවේදීම ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වෙතත් ඉහත 12.2, 13.4 සහ 14 වෙනි වගන්තිවලට යටත්ව, ලැබූ එවැනි අයිතම සියල්ලම සඳහා වන ගෙවීම්, ගනුදෙනුව සිදුකරනු ලැබූ දින සිට දින 180 ක කාලයක් ඇතුළත කාඩ්පත නිකුත් කරන්නාගෙන්/කරන්නන්ගෙන් බැංකුව විසින් ගෙවීම සාථර්කව එකතු කරගත් පසුව පමණක් බැංකුව විසින් වෙළෙන්දා වෙත ගෙවනු ඇත.
- **iii)** බැංකුව විසින් හිමිකම් කියනු ලබන යම් මුදල් ආපසු දීමක් වෙළෙන්දා වෙත ගෙවිය යුතු මුදල ඉක්මවා යන්නේ නම් එහිදී හටගන්නා වෙනස පහත පරිදි අයකර ගනු ඇත.
  - වෙළෙන්දා විසින් බැංකුව වෙත ගිවිය යුතු ණය සැනෙකින් වෙළෙන්දාගේ ගිණුමට හර කරනු ඇත සහ/හෝ
  - හිඟව පවතින මුදල, තදනන්තර බැරකම්වලින් වෙළෙන්දාගේ ගිණුමට අඩුකර ගනු ඇත සහ/හෝ
  - ක්‍රියාමාගර්යක් මගින් වහාම අයකරගනු ඇත.

iv. බැංකුවේ ගිණුමක් නොමැති නම් හෝ පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක ප්‍රමාණවත් මුදලක් නොමැති අවස්ථාවක, වෙළෙන්දා විසින් නම් කරනු ලබන ඍජු හර කිරීමක් සිදුකිරීමට හෝ වෙළෙන්දා විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් හර කිරීමට වෙළෙන්දා විසින් බැංකුවට බලය ලබාදිය යුතුය.

v. හිමිකම් කියනු ලබන මුදලට අමතරව, කාඩ්පත් දරන්නන්ගේ ණයගැතිභාවය වෙනුවෙන් හිඟව තිබෙන දින සිට එම අවස්ථාවේදී පවතින අනුපාතය මත සමාන පොලී මුදලක් බැංකුවේ අභිමතය පරිදි ඔවුන්ගෙන් අයකරගනු ඇත.

vi. ගිවිසුම අවසන් කිරීමත් සමඟම වෙළෙන්දා සතුව පවතින සියලුම උපකරණ, අදාල ද්‍රව්‍ය සහ ලේඛන ඔහුගේ/ඇයගේ වියදමින් වහාම බැංකුව වෙත ආපසු භාරදිය යුතු ය.

vii. වෙළෙන්දාගේ ව්‍යාපාරික පරිශ්‍රය සහ අදාල පද්ධතිවලට ප්‍රවේශය වෙළෙන්දා විසින් ලබාදිය යුතු ය.

viii. මෙයට යා කොට ඇති ඇමුණුම දෙක (2) මගින් විශේෂ කොට දක්වා ඇති පරිදි වෙළෙන්දාගෙන් බැංකුව වෙත හිඟව පවතින සියලුම මුදල් ඔහු/ඇය විසින් පියවිය යුතු ය.

ix. වෙළෙන්දාගේ වලංගු සහ නීත්‍යානුකූල ගනුදෙනු බැංකුව විසින් පියවිය යුතු ය.

ආ) එසේකුදු වුවත්, මෙම ගිවිසුම අවසන් කිරීමට පෙර දැරීමට සිදුවූ යම් බැරකම් සහ ගිවිසුම අවසන් කිරීමේ උන්නතියට පැහැදිළි ලෙස සඳහන් කර ඇති හෝ බලපෑ හැකි යම් ප්‍රතිපාදනයක් (එහෙත් යට සඳහන් කළ 12.2, 13.4, 15, 28 සහ 29 වෙනි වගන්තිවලට සහ මෙම වගන්තියට අගති රහිතව) යන දෙකින් එකක්වත් සම්පූර්ණයෙන්ම බලාත්මතව සහ බලපෑ හැකි පරිදි පැවතිය යුතු ය.

ඇ) ගිවිසුම අවසන් කරනු ලැබූ දින සිට බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන කිසිදු ලියවිල්ලක් (ඒ සඳහා බලය ලබාදී ඇතත් නැතත්) සඳහා ගෙවීම් බැංකුව සිදුනොකරනු ඇත.

ඈ) වෙළෙන්දා විසින් මෙම ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීම හෝ අදාල නීති සහ රීති උල්ලංඝනය කිරීමද ඇතුළුව එහෙත් වෙළෙන්දා මුදල් විශුද්ධිකරණ නීති පද්ධතියට පටහැනිව කටයුතු කිරීම යන කරුණට සීමා නොවී යන හේතුන් මත හැර මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කරනු ලබන අවස්ථාවේදී හිඟව පවතින සියලුම මුදල් බැංකුව විසින් පියවිය යුතු ය.

ඉ) වෙළෙන්දා විසින් මෙම ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීම හෝ අදාල නීති සහ රීති උල්ලංඝනය කිරීමද ඇතුළුව එහෙත් වෙළෙන්දා මුදල් විශුද්ධිකරණ නීති පද්ධතියට පටහැනිව කටයුතු කිරීම යන කරුණට සීමා නොවී යන හේතුන් මත හැර මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කරනු ලබන අවස්ථාවේදී, යම් විමශර්නයක් සම්පූර්ණ වන තෙක් සහ/හෝ ඊට අදාලව පවත්වාගෙන යනු ලබන නඩුකරයක් අවසන් වන තෙක් සහ/හෝ නියාමක අධිකාරියක් විසින් නියම කරනු ලබන ආකාරයෙන් ගෙවීම් සිදුකරනු ලබන තෙක්, කළ යුතු ගෙවීම් රඳවා තබාගැනීමට බැංකුවට හිමිකම තිබිය යුතු ය.

ඊ) මෙම ගිවිසුම යටතේ වෙළෙන්දා වෙත ලබාදී ඇති උපකරණය යම් ඕනෑම හේතුවක් මත භාවිතා කිරීම ඔහු/ඇය විසින් අත්හිටුවනු ලැබුවහොත්, ඔහු විසින් සියලුම වෙළඳ ස්ථානවල ප්‍රදශර්නය කර ඇති යම් අදාල ද්‍රව්‍ය එකී ස්ථානවලින් ඉවත් කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාගර් වෙළෙන්දා විසින් ගත යුතු ය.

උ) නීතිවිරෝධී හෝ නීතියට පටහැනි යැයි සිතිය හැකි හේතුවක් මත මෙම ගිවිසුම බැංකුව විසින් අවසන් කරනු ලබන අවස්ථාවක වෙළෙන්දාගේ නම නියාමකයින් සමඟ තිබෙන කොටස් තොරතුරු අපලේඛනය කිරීමට බැංකුවට අයිතියක් ඇත.

**32.** පැවරීම

මෙම ගිවිසුම පවරා දිය නොහැකි වුවද යම් හෙයකින් වෙළෙන්දා තනි පුද්ගලයෙකු හෝ පුද්ගලයින් කිහිපදෙනෙකු වන අවස්ථාවක ඔහුගේ/ඇයගේ හෝ ඔවුන්ගේ විෂයවූ පදවි මෙන්ම උරුමක්කරුවන්, බලකරුවන් (බූදලයක)/කළමණාකරුවන් මෙම ගිවිසුමෙන් බැඳේ. මෙම ගිවිසුම හෝ මෙහි දැක්වෙන බැංකුවේ ඕනෑම අයිතීන් සහ බැඳීම් අඛණ්ඩව කරගෙන යම සඳහා පැවරීමට බැංකුවේ ඕනෑම පරිපාලිත හෝ සම්බන්ධිත සමාගමකට හෝ බැංකුවේ ඒකාබද්ධ සමාගමකට උපකොන්ත්‍රාත් දීමට හෝ ඕනෑම නියෝජිතයෙකු/නියෝජිතයින් පත්කිරීමේ අයිතිය බැංකුව වෙත තබාගනී.

**33.** නියෝජනය සහ පොරොන්දු

**33.1** එක් එක් පාශර්වය විසින් අනෙක් පාශර්වය වෙත පහත සඳහන් නියෝජනයන් සහ පොරොන්දු ලබාදිය යුතු අතර, මෙම ගිවිසුමට ඇතුළත්වීමේදී එකී නියෝජනයන් සහ පොරොන්දු මත විශ්වාසය තබන බව එවැනි අනෙක් පාශර්වය පිළිගනී.

බලය ලබාදීම

පහත දැක්වෙන කරුණු වෙනුවෙන් පාශර්වය නියෝජනය කරමින් පොරොන්දු වේ (සාමූහිකව, බලය ලබාදීම පොරොන්දුවීම)

(i) වෙළෙන්දා නිත්‍යානුකූලව සංස්ථාපනය කරන ලද ආයතනයක් හෝ භාණ්ඩ සහ/හෝ සේවාවන් විකිණීමට නීත්‍යානුකූලව බලය ලබාදෙන ලද ආයතනයක් බවට වෙළෙන්දා පොරොන්දු වේ.

(ii) එය සංස්ථාපනය කරන ලද අධිකරණ කලාබයේ නීති යටතේ

(iii) සියලුම අධිකරණ කලාපවල සිය ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාමට එය විධිමත්ව ලියාපදිංචි කර ඇත.

(iv) සිය ව්‍යාපාරික කටයුතු එක් එක් අධිකරණ කලාපයේ නීත්‍යානුකූලව සිදුකරගෙන යාමට එය සතුව සියලුම බලපත්‍ර, නියාමන අනුමැතීන්, අවසර සහ බලය පවතී.

(v) මෙම ගිවිසුම ඉෂ්ඨ කිරීමටත්, එමගින් අරමුණු කරගෙන සිටින ගනුදෙනු සිදුකිරීමටත්, එහි බැඳීම් පවත්වාගෙන යාමටත් අවශ්‍ය කරනු ලබන සංස්ථාපිත බලය, අධිකාරත්වය සහ නීත්‍යානුකූල අයිතිය එයට ඇත.

*වලංගුතාවය*

(i) පාශර්වයන් විසින් මෙම ගිවිසුම වරක් විධිමත්ම හස්තාංකනය කළ පසුව එය එහි දැක්වෙන නියමයන්ට අනුකූලව වලංගු ලෙස සංස්ථාපනය වන බවටත් පාශර්වයන් මත බැඳීම් ඇති කරනු ලබන බවටත් එක් එක් පාශර්වය නියෝජනය කරමින් පොරොන්දු වේ.

(ii) මෙම ගිවිසුමට ඇතුළත්වීමට සහ එහි දැක්වෙන බැඳීම් ඉෂ්ඨ කිරීමට නීත්‍යානුකූලව හෝ ගිවිසුම්ගතව අවශ්‍ය කරනු ලබන යම් පුද්ගලයෙකුගේ හෝ රජයේ දෙපාතර්මේන්තුවක හෝ ඒජන්සියක සියලුම අනුමැතීන් සහ කැමැත්ත අදාල එක් එක් පාශර්වය විසින් ලබාගෙන ඇති හෝ ලබාගත යුතු බවට එක් එක් පාශර්වය නියෝජනය කරමින් පොරොන්දු වේ.

*ගැටුම් නොමැති බව*

(අ) මෙම ගිවිසුම හස්තාංකනය කිරීම සහ (ආ) පාශර්වයක් විසින් මෙම ගිවිසුම පරිසමාප්ත කිරීම යන දෙකින් කොයික සිදුවුවහොත් (i) සංස්ථාපනය කිරීමේ සහතිකය හෝ අතුරු නීති හෝ පාශර්වයේ යම් වෙනත් සංස්ථාපිත හෝ ව්‍යවස්ථාපිත ලේඛනයක් හෝ (ii) එයට පාශර්වයක් වන ඕනෑම කොන්ත්‍රාත්තුවක් යටතේ පාශර්වයක බැඳීම් උල්ලංඝනය කිරීම හෝ (iii) අදාල ඕනෑම නීතියක් උල්ලංඝනය කිරීම එකිනෙකට වෙනස්ව සිටින බවට එක් එක් පාශර්වය නියෝජනය කරමින් පොරොන්දු වේ.

*නඩු මාගර්යෙන් කටයුතු කිරීම*

මෙම ගිවිසුම යටතේ එහි බැඳීම් ඉටු කිරීමට, එහි හැකියාව මත සාධාරණව බලාපොරොත්තු වන ද්‍රව්‍යාත්මක හානිකර බලපෑමක් ඇතිවීමට, පාශර්වයේ දැනුවත්කමට, පාශර්වයට හෝ එහි යම් සම්බන්ධ කරගැනීමකට විරුද්ධව තජර්නය කරමින් හෝ බලපෑම් අතිකරමින් නඩු මාගර්යෙන් කටයුතු කිරීමක්, පටිපාටිකරයක් හෝ ඕනෑම ආකාරයක විසඳීමට තිබෙන විමශර්නයක් නොමැති බවට එක් එක් පාශර්වය නියෝජනය කරමින් පොරොන්දු වේ.

**33.2** මෙහි විශේෂයෙන්ම දක්වා ඇති එවැනි කරුණු හැර බැංකුව විසින් හෝ ඒ වෙනුවෙන් සාදා ඇති ඕනෑම නියෝජනයක් හෝ පොරොන්දුවීමක් (ලිඛිත හෝ වාචික වේවා සහ, කියා සිටිමින් හෝ ව්‍යංගව) මත විශ්වාසය තබමින් වෙළෙන්දා මෙම ගිවිසුම ඇතුළත්වී නොමැති බවට ඔහු/ඇය පිළිගනිමින් එකඟ වේ.

**34.** අත්හැරීමේ ලියවිල්ල

මෙම ගිවිසුමේ දැක්වෙන නියමයන් එකක් හෝ ඊට වැඩි ගණනක් ඕනෑම අවස්ථාවක හෝ යම් කාලපරිච්ඡේදයක් සඳහා බලාත්මක කිරීමට බැංකුව අපොහොසත්වීම, එවැනි අයිතියක් හෝ පිළියමක් හෝ මෙම ගිවිසුමේ දැක්වෙන සියලුම කොන්දේසි සහ නියමයන් ඕනෑම අවස්ථාවක තදනන්තරව බලාත්මක කිරීමට අයිතිය අත්හැරීමේ ලියවිල්ලක් නොවිය යුතු ය.

**35.** **පොදු**

**35.1** **හිමිකමක්/තනි පුද්ගලයෙකු/හවුල් ව්‍යාපාරයක් විසින් අත්සන් කරන්නේ නම් "වෙළෙන්දා" යන ප්‍රකාශයට එවැනි සමාගමක/හිමිකමක ව්‍යාපාරයක් කලින් කලට කරගෙන යනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයින් ඇතුළත් විය යුතු ය. මෙයට අත්සන්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටින්නේ නම්, "වෙළෙන්දා" යන ප්‍රකාශයට ඔවුන් සියලුම දෙනාම සහ එක් එක් කෙනා ඇතුළත්විය යුතු අතර, මෙම ගිවිසුම යටතේ ඔවුන්ගේ වගකීම් එක්ව සහ වෙන් වෙන්ව විය යුතු ය.**

**35.2** **මෙම ගිවිසුම බලපැවැත්වීම සහ අර්ථ විග්‍රහ කිරීම ශ්‍රී ලංකාවේ නීතියට අනුකූලව සිදුවිය යුතු ය. මෙම ගිවිසුමට අදාලව තනි අනන්‍ය අධිකරණ කලාපය සහ නීති කෘත්‍ය සඳහා ස්ථානය, කොළඹ විය යුතු ය.**

**35.3** **මෙම ගිවිසුම සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක දැක්වෙන ප්‍රතිපාදනයක් ඕනෑම පැනවීමක් හෝ නීතියේ පාලනයට යටත්ව නීතිවිරෝධී, අවලංගු හෝ ක්‍රියාත්මක විය නොහැකි හෝ එසේ වී හෝ එසේ විය හැකි බවට දැනගතහොත් එවැනි ප්‍රතිපාදනයක් හෝ කොටසක් මෙම ගිවිසුමෙන් මකා දැමිය යුතු බවට සැලකෙන අතර, එමගින් ගිවිසුමේ ඉතිරිවන ප්‍රතිපාදනවල නීත්‍යානුකූලභාවයට, වලංගුභාවයට සහ ඒවායේ ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට කිසිඳු ආකාරයකින් බලනොපෑ යුතු ය.**

**35.4** **මෙම ගිවිසුම පිළිගත් ගිවිසුමක් බවට පත්වනුයේ එය බැංකුව වෙනුවෙන් සහ වෙළෙන්දා වෙනුවෙන් යන දෙදෙනාම අත්සක් කිරීමෙන් බවට දෙපාශර්වය එකඟ වේ.**

**35.5** **කිසියම් පාශර්වයක් විසින් අනෙක් පාශර්වය වෙත සිදුකරනු ලබන සන්නිවේදන ලිඛිතව, පෞද්ගලිකව හෝ පෙර ගෙවුම් ලියාපදිංචි තැපෑලෙන් එකී අනෙක් පාශර්වයේ යෝග්‍ය ලිපිනය වෙත ඉහතින් දක්වා ඇති පරිදි ලබාදිය යුතු අතර, එ සඳහා පහත සඳහන් ආකෘතිය ප්‍රයෝජනයට ගත හැකි ය.**

බැංකුව
තනතුර : කළමනාකරු - වෙළාදාම් අත්පත් කරගැනීම්
ලිපිනය : ඩීඒෆ්සීසී පීඒල්සී, ලේක් හවුස් ගොඩනැගිල්ල, අංක 35,
ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
දු.ක. අංක : **0112880880/0112350000**

වෙළෙන්දා : ..........................................................................................
නම : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
දු.ක. අංකය : ..........................................................................................
විද්‍යුත් තැපැල් : ..........................................................................................

**35.6** **මෙම ගිවිසුමේදී සංදහර්ය විසින් පුරුෂලිංගත්වය ප්‍රකාශ කිරීමට ඉඩදෙන හෝ අවශ්‍ය කරනු ලබන වචන සඳහා ස්ත්‍රීලිංගිකත්වය සහ නපුංසකත්වයද, ඒකවචනයෙන් තිබෙන වචන සඳහා බහුවචනය සහ ප්‍රතිලෝම වශයෙන් ඇතුළත්විය යුතු ය.**

**36.** **ගිවිසුම වෙනස්වීම**

**මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය සෑමවිටම බැංකුව සතුව රඳවා තබාගනී. සිදුකරනු ලබන එවැනි යම් වෙනස් කිරිමක් හෝ සංශෝධනයක් හෝ හඳුන්වාදීමක් බලාත්මක වනු ඇත්තේ දෙපාශර්වය අතර ලිඛිත සංශෝධනයක්/හුවමාරු කිරීමක් ඇතුළත් කොට ඒ සඳහා වෙළෙන්දා බැඳෙන්නේ නම් පමණි.**

**37.** **නීතිවිරෝධී නිෂ්පාදන**

**37.1** අදාල නීති හෝ බැංකුවේ අභ්‍යන්තර පිළිවෙත් උල්ලංඝනය කරනු ලබන කිසිඳු නිෂ්පාදනයක්, (නීතිවිරෝධී නිෂ්පාදනවලට අදාල ගෙවීම්ද ඇතුළුව) බැංකු සේවාවක්, තහනම් කර ඇති කිසිඳු ගනුදෙනුවක් උදෙසා බැංකුව විසින් ලබානොදිය යුතු බවට වෙළෙන්දා පිළිගනී. බැංකුව විසින් කලින් කලට එකඟවිය හැකි ලෙස ඉල්ලා සිටිනු ලබන පරිදි වෙළෙන්දාගේ නිෂ්පාදන සම්බන්ධ බැංකු තොරතුරු බැංකුව විසින් වෙළෙන්දාට ලබාදිය යුතු ය. ඕනෑම අදාල නීතියක් යටතේ ගනුදෙනුකරුවන්ට විකිණීමට තහනම් කර ඇති කොන්දේසි අඩංගු නිෂ්පාදන බැංකුවේ පාර්ශවය ඔස්සේ නොවිකුණන බවටත්, කිසිඳු

නීතිවිරෝධී නිෂ්පාදනයකට ("නීතිවිරෝධී ගනුදෙනු") මැදිහත් වන හෝ අදාල වන ගනුදෙනුවක් බැංකුවේ පිරිසැකසුම්කරණය සඳහා ඉදිරිපත් නොකරන බවටත් වෙළෙන්දා වගබලාගනු ඇත. යම් නීතිවිරෝධී ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකු සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුවට තිබෙන අතර, එවැනි නීතිවිරෝධී ගනුදෙනුවක් හේතුකොට ගෙන හෝ ඒ සම්බන්ධයෙන් බැංකුවට සිදුවන යම් උපද්‍රවයකින්, හානියකින් පාඩුවකින් සහ වගකීම්වලින් බැංකුව මුක්තිදානය කොට ඊට අදාල සියලු හානිපූරණය කිරීම් සහ වගකීම් වෙළෙන්දා විසින් දැරිය යුතු ය.

**37.2** නිෂ්පාදන

**මෙම ගිවිසුමට අනුකූලව බැංකු සේවාවන් ඒ ඒ වෙළෙන්දා විසින් භාවිතා කළ යුත්තේ වෙළෙන්දාගේ මූලික ව්‍යාපාරික කටයුතුවලට අදාල නිෂ්පාදන සඳහා පමණක් බවට වෙළෙන්දා වගබලාගත යුතු ය.**

**38.** නීතියට අනුකූලවීම

**38.1** පොදු

**මෙම ගිවිසුම යටතේ සිය ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සහ එහි බැඳීම් ක්‍රියාවේ යෙදවීමේදී ඒ සම්බන්ධයෙන් වන ඕනෑම නීතියකට අනුකූලව කටයුතු කරනු ලබන බවට එක් එක් පාශර්වය පොරොන්දු වේ. පාශර්වයන් නීතියට අනුකූලව කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම පිණිස සහ එවැනි දෑ කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය කරනු ලබන එවැනි වාතර්ා ඒ ඒ වෙළෙන්දා සහ බැංකුව විසින් සිය වියදමින් තබාගත යුතු අතර, ඉදින් යම් අදාල නීතියකට පටහැනිව හෝ එය උල්ලංඝනය වන කිසිවක් පාශර්වයන් විසින් සිදුනොකළ යුතු බවට සැමවිටම වගබලා ගත යුතු ය.**

**38.2** තොරතුරු තහවුරු කිරීම

**පාශර්වයන් සිය බැඳීම් සම්බන්ධයෙන් සෑහීමට පත්වීම සහ අදාල නීතිය යටතේ අදාල අවශ්‍යතා සමඟ අනුකූලවීම පිණිස, බැංකුවේ ඉල්ලීම මත වෙළෙන්දා විසින් වාතර්ා සහ තොරතුරු බැංකුව සමඟ කලින් කලට බෙදාහදා ගනු ලබන අතර, අදාල වාතර්ා සහ තොරතුරු (ගනුදෙනුවලට අදාල තොරතුරු සහ වාතර්ා හෝ අදාලවන නීතියේ වෙනස්වීම්ද ඇතුළුව) අවශ්‍ය පරිදි පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම සඳහා රජයේ නියෝජිතායතනවලට, නියාමන අධිකාරිවලට සහ තුන්වන පාශර්වයේ සේවා සැපයුම්කරුවන්ට ලබාදීමට අවශ්‍ය අවසරය වෙළෙන්දා විසින් බැංකුවට ලබාදෙනු ඇත. කෙසේ වෙතත් බැංකුව සතු අදාල වාතර්ා සහ තොරතුරු, වෙළෙන්දා වෙත පියවීම් සකස් කිරීම සඳහා ගෙවීම් තහවුරු කිරීමට සීමා විය යුතු ය.**

**38.3** මුදල් විශුද්ධිකරණ අවශ්‍යතා

**මුදල් විශුද්ධිකරණයට, ප්‍රති-ත්‍රස්තවාද මූල්‍යකරණයට සහ සම්බාධකවලට ("මුදල් විශුද්ධිකරණය" සමඟ) අදාල සියලුම නීතිවලට බැංකුව සහ වෙළෙන්දා යන දෙදෙනාම අනුකූල විය යුතු අතර, වෙළඳ කළමනාකරණය, සම්බාධක සහ දේශපාලනික වශයෙන් ප්‍රසිද්ධියක් ලබා ඇති පුද්ගලයින් පිළිබඳ විමශර්නය, සැක සහිත ගනුදෙනු විමශර්නය සහ වාතර්ා කිරීමද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී බැංකුවේ මුදල් විශුද්ධිකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්ට පූණර් සහයෝගය දැක්විය යුතු ය. කෙසේ වෙතත්, වෙළෙන්දාගේ මුදල් විශුද්ධිකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් වෙත බැංකුව විසින් දක්වනු ලබන සාධාරණ වූ නිසි සම්ප්‍රජන්‍යතාවය (ලිඛිතව හෝ වෙනත් හැටියකින්) සමඟ වෙළෙන්දා පූණර් සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.**

**38.4** සීමා කිරීම සහ වාතර්ා කිරීම

**මුදල් විශුද්ධිකරණය, ප්‍රති-වංචා කිරීම සහ අනිකුත් අනුකූලවීම් සහ ආරක්ෂක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්ට අනුව, වෙළෙන්දා විසින් බැංකුවේ සේවාවන් භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධ සාධාරණ වූ සීමා කිරීම් සහ පාලනය කිරීම් බැංකුව විසින් පනවනු ඇත. එවැනි සීමා කිරීම්, ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ වෙළෙන්දා විසින් සිදුකරගෙන යනු ලබන සමහර ගනුදෙනු සම්බන්ධ යම් බැංකු සේවාවක් අත්හිටුවීම/අවහිර කිරීමද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී කටයුතු කිරීමේ අයිතිය බැංකුවට ඇත. අදාල සැකසහිත ගනුදෙනු වාතර්ා කිරීමට අනුකූලවීමේ සහ අදාල නීතිය යටතේ රහසින් අවවාද කිරීමේ අවශ්‍යතාවෙහි කාර්ය පිණිස කිසිදු පාශර්වයකට දැනුම්දීමක් රහිතව බැංකුව විසින් සැකසහිත ගනුදෙනු අදාළ අධිකාරි වෙත වාතර්ා කරනු ඇත.**

**39.** වංචා සහ අවදානම

**39.1** බැංකුවේ උපකරණය භාවිතා කරමින් බැංකුවේ කටයුතු ඔස්සේ වෙළෙන්දා විසින් යම් අනවසර ගෙවීමක් හෝ වෙනත් හැටියකින් වංචාකාරී ගනුදෙනුවක් ඉදිරිපත් කර ඇති බවට බැංකුව / ගනුදෙනුකරු විසින් කියා සිටින්නේ නම්, වෙළෙන්දා පහත දැක්වෙන නීතිවලට අනුකූලව කටයුතු කරනු ඇත.

(අ) ගනුදෙනුවට අදාල සාක්ෂි
බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබනවිට ගනුදෙනුවට අදාල සාක්ෂි වැඩකරන දින පහක් (05) ඇතුළත වෙළෙන්දා විසින් බැංකුවට ලබාදිය යුතු ය.

(ආ) ප්‍රතිපූරණය
ගනුදෙනුවට අදාල සාක්ෂි බැංකුවට නොලැබෙන්නේ නම් හෝ අනවසර ගෙවීම වෙළෙන්දා විසින් හිතාමතාම සිදුකරන ලද එකක් හෝ නොසැලකිල්ල හේතුකොට ගෙන සිදුවූවක් නම්, ප්‍රශ්නගත ගනුදෙනුව සම්බන්ධයෙන් වෙළෙන්දා විසින් නම් කරන ලද, බැංකුවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමට බැංකුව විසින් පියවන ලද මුදලට සමාන මුදලක් වෙළෙන්දා විසින් බැංකුවට ගෙවිය යුතු ය.

(ඇ) බැඳීම ප්‍රතිපූරණය
ඉදින් ගනුදෙනුවට අදාල සාක්ෂි ඉල්ලා ඇත්නම්, යම් අනවසර ගෙවීම් සිදුකර ඇති අවස්ථාවක ගනුදෙනුකරුගෙන් නිසි විමසීමක් සිදුකිරීමෙන් පසුව බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ප්‍රතිපූරණය කිරීමට තීරණය කරනු ඇත. වෙළෙන්දා සහ බැංකුව අතර (එක් එක් පාශර්වය විසික් සාධාරණ ලෙස කටයුතු කරනු ලබන) එකඟ වූ මුදල ගනුදෙනුකරු වෙත ප්‍රතිපූරණය කිරීම හේතුකොට ගෙන බැංකුවට සිදුවිය හැකි යම් උපද්‍රවයකින් බැංකුව මුක්තිදානය කරනු ලබන බවටත් එකී මුදල වෙළෙන්දා විසින් දරනු ලබන බවටත් වෙළෙන්දා එක්ව සහ වෙන් වෙන්ව එකඟ වේ.

**39.2** යම් ගනුදෙනු ප්‍රමාණයක් නීතිවිරෝධී ගනුදෙනු, අනවසර ගෙවීම් හෝ වෙනත් හැටියකින් වංචාකාරී ලෙස සිදුකරන ලද ගනුදෙනු බවට බැංකුව සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, එවැනි අවස්ථාවකදී බැංකුව විසින් දෙන ලද පූවර් ලිඛිත දැනුම්දීමකින් පසුව ඔවුන්ගේ අවදානම් කළමනාකරණ ධාරිතාවයන්ගේ වැඩබිම් සමාලෝචන පැවැත්වීමේ කායර්ය පිණිස සහ වෙළෙන්දාගේ සඵලතාවය මත (අදාල වන්නේ නම්) එකී නීතිවිරෝධී ගනුදෙනු, අනවසර ගෙවීම් හෝ වෙනත් හැටියකින් වංචාකාරී ලෙස සිදුකරන ලද ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමට සාමාන්‍ය ව්‍යාපාරික කාලසීමාව තුළදී වෙළෙන්දාගේ පරිශ්‍රය වෙත ප්‍රවේශය බැංකුවට ලබාදීමට වෙළෙන්දා එකඟ වේ.

**40.** සම්බන්ධතාවය
මෙම ගිවිසුමෙහි අඩංගු කිසිවක් පාශර්වයන් අතර බද්ධ ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක්, නියෝජිතායතනයක්, භාරකාර හෝ පාශර්වයන් කෙරෙහි හෝ අතර සේවා සම්බන්ධතාවයක් ලෙස අථර් දැක්වනු ඇත.

**41.** අනුපාතික බලපෑම
මෙම ගිවිසුමේ දැක්වෙක බැඳීම් ඉෂ්ඨ කිරීමේදී පාශර්වයන්ගේ හෝ ඔවුන්ගේ අනුබද්ධ ආයතනවල හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ සාධාරණ වූ ක්‍රියාකාරකම් හැර ස්වභාවධමර්යේ ක්‍රියාකාරකම් හෝ පාශර්වයන්ගේ පාලනයෙන් එහා ගිය බලපෑම් හෝ හේතුකාරක නිසා ඒවාද ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී සෘජුව හෝ වක්‍රව සිදුවන කිසිඳු ආකාරයක ප්‍රතිඵලයක් වෙනුවෙන් පාශර්වයන් වගකීමට බැඳී නොසිටී. එනම් (i) ගිනි, ගංවතුර, ස්වභාවධමර්යේ මූලාවයව හෝ ස්වභාවධමර්යෙන් සිදුවන ක්‍රියාවන්/දේව ක්‍රියා, (ii) යුධ සටන් පැතිරීම හෝ ඉහළයාම, යුද්ධ, කැරලි කෝලාහල හෝ සිවිල් කැළඹීම්, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් (iii) අන්තජර්ාලය ඇණහිටීම, පරිගණක, විදුලිසංදේශ, විදුලි බලය ඇණහිටීම හෝ යම් වෙනත් උපකරණයක් ක්‍රියාවිරහිතවීම (iv) කම්කරු ආරවුල් (සේවකයින්ගේ ඉල්ලීම් සාධාරණ වුවත් නැතත් හෝ සෑහීමට පත්වීමට පාශර්වයන්ගේ බලය තුළ) (v) බලපෑමට ලක්වූ පාශර්වය තහනම් කරමින් හෝ බාධා කරමින් රජයේ අධිකාරියක (හෝ එහි අනුබද්ධ ආයතනයක හෝ නියෝජිතායතනයක) ක්‍රියාවක් හෝ ප්‍රමාදයක්. මෙම ගිවිසුම යටතේ සිය බැඳීම් ඉෂ්ඨ කිරීමේදී මෙරට හෝ විදේශ උසාවියක් හෝ විනිශ්වය සභාවක් විසින් දෙන ලද තීන්දුවක්ද ඇතුළුව, රජය විසින් පනවන ලද සීමා කිරීම්,

සම්බාධක, විදේශ විනිමය පාලනය කිරීම් ආදිය හෝ (vi) පාශර්වයේ සාධාරණ පාලනයෙන් එහා ගිය ඒ හා සමාන යම් හේතුවක් වෙනුවෙන් තුන්වන පාශර්වයක ක්‍රියා නොකිරීමක් (සාමූහිකව, අනුපාතික බලපෑම් අවස්ථාව) ආදිය වේ. අනුපාතික බලපෑමේ අවස්ථාවක් සිදුවුව හොත්, එකී අනුපාතික බලපෑමේ අවස්ථාව අඛණ්ඩව පවතින තාක් කල් පමණක් සහ එවැනි අනුපාතික බලපෑමේ අවස්ථාවක් සිදුවන තරමට පමණක් සහ ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීමට වාණිජ වශයෙන් සාධාරණ වූ ප්‍රයත්නයන් ආරම්භ කරනු ලබන තාක් කල්, එකී අවස්ථාව විසින් බලපෑමට ලක්වූ බැඳීම් ක්‍රියාවට නැංගවීමේදී කටයුතු නොකරන පාශර්වය තවදුරටත් යම් වගකීම් ක්‍රියාවට නැංවීමෙන් නිදහස් කරනු ඇත.

**42.** සම්පූර්ණ ගිවිසුම

මෙම ගිවිසුම, මෙහි දක්වා ඇති විෂයගත කරුණ සම්බන්ධයෙන් පාශර්වයන් අතර ඇතිකර ගනු ලැබූ සමස්ථ ගිවිසුම වන අතර, එමගින් යම් වෙනත් පූවර් ගිවිසුම් සහ අවබෝධතා අවලංගු වේ.

**43.** පවරා දීම

මෙම ගිවිසුම නීත්‍යානුකූලව හෝ වෙනත් හැටියකින් ක්‍රියාත්මක කිරිමේදී මෙම ගිවිසුමට තිබෙන බැංකුවේ සහ වෙළෙන්දාගේ අයිතිවාසිකම් සහ බැඳීම් පැවරීම, මාරු කිරීම, උපකොන්ත්‍රාත් දීම හෝ බැංකුව සහ වෙළෙන්දා විසින් අභිනියෝජනය කිරීම සිදු කල නොහැකි ය.

**44.** මාතෘකා

මාතෘකා යොදා ඇත්තේ යොමුගත කිරීමේ කායර්ය පිණිස පමණක් වන අතර, කිසිඳු අයුරකින් ඒවා අථර් දැක්වීම, සීමා කිරීම, සම්ප්‍රයෝජනය කිරීම හෝ අදාල වගන්තියේ විෂයපථය හෝ ප්‍රමාණය විස්තර කිරීම සිදු නොකළ යුතු ය.

**45.** භාෂාව

මෙම ගිවිසුම සකස් කර ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙනි. ගිවිසුමේ මුල් ඉංග්‍රීසි අනුවාදය සහ පරිවතර්නය අතර යම් නොගැලපීමක් තිබෙන අවස්ථාවක ඉංග්‍රීසි අනුවාදය බලාත්මක විය යුතු ය.

ඊට සාක්ෂි පිණිස පාර්ශවයන් විසින් මෙම ගිවිසුමට පහත ලියා ඇති වර්ෂයේ සහ දිනයේ හස්තාංකනය කරනු ලැබේ.

<u>බැංකුව</u>

ඩීඑෆ්සිසී බැන්ක් පිඑල්සී හි අත්සන්කරුවන් වන .......................................................... සහ ................................................. යන අය විසින් දෙදහස් ...................... (20....) ක්වූ ........................... මස ..................... දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ කොළඹදී අත්සන් කරනු ලැබේ.

සාක්ෂි

1.

2.

<u>වෙළෙන්දා</u>

*** සටහන : *අදාල නොවන වචන කපා හැර අදාල වගන්තිය සම්පූණර් කරන්න***

***වෙළෙන්දා තනි පුද්ගලයෙකු නම්***

වෙළෙන්දා වන ............................................. යන අය විසින් දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ කොළඹදී අත්සන් කරනු ලැබේ. }

සාක්ෂි

1.

2.

***වෙළෙන්දා හිමිකරුවෙකු නම්***

වෙළෙන්දා වන ............................................ හි හිමිකරු වන ........................................... යන අය විසින් දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කරනු ලැබේ. }

සාක්ෂි

1.

2.

*වෙළෙන්දා හවුල්කරුවෙකු නම්*

වෙළෙන්දා වන ......................................................... හි හවුල්කරුවන් වන ...................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
.......
යන අය විසින් දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කරනු ලැබේ.

සාක්ෂි

1.

2.

*වෙළෙන්දා සමාජයක්/සමිතියක් නම්*

**වෙළෙන්දා වන ......................................................... සමාජයේ/සමිතියේ බලයලත් අත්සන්කරු/අත්සන්කරුවන් ................................... සහ ...................................**
**යන අය විසින්** දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කරනු ලැබේ.

සාක්ෂිකරුවන්

1.

2

*වෙළෙන්දා රාජ්‍ය ආයතනයක් නම්*

**වෙළෙන්දා වන ....................................................... හි බලයලත් අත්සන්කරු/අත්සන්කරුවන් වන ................................. සහ .................................... යන අය විසින්** දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කරනු ලැබේ.

සාක්ෂි

1.

2.

*වෙළෙන්දා සමාගමක් නම්*

**වෙළෙන්දා වන ....................................................... හි බලයලත් අත්සන්කරු/අත්සන්කරුවන් වන ................................. සහ .................................... යන අය විසින්** දෙදහස් .......................... (20.........) ක්වූ ........................... මස ............ දින පහත සාක්ෂිකරුවන් ඉදිරියේ අත්සන් කරනු ලැබේ.

සාක්ෂි

1.

2.

<u>හෝ</u>

මෙහි සඳහන් සමාමේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු වන ................................ සහ ................................. යන අය විසින් එකී සමාගමේ පොදු මුද්‍රාව තබා එකී පොදු මුද්‍රාව සහතික කරමින් පහත අය ඉදිරියේ වර්ෂ දෙදහස් ............ (20.....) ක්වූ ...................... මස ........... වෙනි දින කොළඹදී අත්සන් කරන ලදි.

සාක්ෂි

1.

2.